# ඉගෙනුම් අත්වැල
# නාට්‍ය හා රංග කලාව

## 9 ශ්‍රේණිය - 3 වාරය



සෞන්දර්ය අංශය
අධ්‍යාපන අමාත්‍යංශය
ඉසුරුපාය
බත්තරමුල්ල

# 06-11 නාට්‍ය හා රංග කලාව විෂය ස්වයං අධ්‍යයන අත්වැල සම්පාදක කණ්ඩායම

අචිනි නයන්තරා මෙය - ගුරු වෘත්තික - ව/ගල්/ඇහැටුවැව බණ්ඩාරනායක ම. වි. මහව.

අශෝක චන්ද්‍රසේකර මයා - ගුරු වෘත්තික - ව/නික/සංඝබෝධි ම. ම. වි. අවුලේගම.

ඉන්දු මැණිකේ මිය - ගුරු වෘත්තික - ව/හලා/ධම්මිස්සර ජා. පා. නාත්තණ්ඩිය.

ගයාන් රන්දීර මයා - ගුරු වෘත්තික - බප/මිනු/සෙනරත් පරණවිතාන ජා. පා, උඩුගම්පොල.

ගාමිණී බස්නායක මයා - ගුරු වෘත්තික - අම්/මහ/මිරිස්වත්ත ද්වි.පා. පදියතලාව.

ජයනි කපුගේ මිය - ගුරු වෘත්තික - බප/කො/සිරිමාවෝ බණ්ඩාරනායක විද්‍යාලය, කොළඹ 07.

මහේෂා විජේසිංහ මිය - ගුරු වෘත්තික - මප/ගම්/ශා. ජෝශප් බා.වි. ගම්පොල.

රසිකා රත්නායක මිය - ගුරු වෘත්තික - බප/කො/ක්ලිෆ්ටන් බා. වි. කොළඹ 10.

රංගන වන්නකුආරච්චි මයා - ගුරු වෘත්තික - බප/ගම්/බණ්ඩාරනායක ජා. පා. ගම්පහ.

ලලිත අතාවුද මයා - ගුරු වෘත්තික - බප/ජය/සුභූති ජා. පා. බත්තරමුල්ල.

වරුණ අලහකෝන් මයා - නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ, අධ්‍යාපන අමාත්‍යාංශය, ඉසුරුපාය, බත්තරමුල්ල.

ශාලිකා රංතිලක මිය - කථිකාචාර්ය, මහරගම ජා.අ.වි. පීඨය, මහරගම.

සරසි පීරිස් මෙය - ගුරු වෘත්තික - සබ/ර/ ප්‍රඥාධීර වි, කහවත්ත.

සුභාෂිනී හේරත් මිය - ගුරු වෘත්තික - උමැ/අ/නිවත්තක චෛතිය ම. වි. අනුරාධපුර.

සුරංගි කෝසලා මිය - ගුරු වෘත්තික - බප/පිළි/ පිලියන්දල ම. ම. වි. පිලියන්දල.

සුලෝචනා ප්‍රියදර්ශනී මිය - ගුරු වෘත්තික -මප/නු/ අඹගමුව ම. වි. හැටන්.

## ➢ එදිරිවීර සරච්චන්ද්‍ර



**දේශීය** නාට්‍ය කලාවේ විශාල පෙරලියක් ඇති කරන ලද මෙරට ලාංකිකයන්ගේ නැතිවී ගිය දෙස,බස, රස උරුමයන් රැකගැනීම උදෙසා විවිධ ක්ෂේත්‍ර ඔස්සේ තම නිර්මාණ පෞරුෂය නාට්‍ය කලාවට දායාද කළ ඒ අසමසම යුග පුරුෂයා එදිරිවීර සරච්චන්ද්‍රයන්ය. තමත් උගත් ඉංග්‍රීසි ලතින් බස හැර දමා සිංහල බස/ සාහිත්‍ය,සෞන්දර්ය, නාට්‍ය කලාව යන ක්ෂේත්‍ර ඔස්සේ දේශයේ අනාගතය නවමු මගකට යොමු කල නිර්මාණකරුවා ඔහු විය.

- මෙතුමන් මුල් කාලීනව නාට්‍ය රචනා කොට ඇත්තේ ගුවන් විදුලි විකාශනය උදෙසා ය. පසු කලෙක එම නාට්‍ය රංග භූමිය සඳහා සකස් කර නිෂ්පාදනය කරන්නට විය. එම නාට්‍ය අතර, **"රත්තරං ","කදාවළලු"** පෙන්වාදිය හැක.
- කොළඹ විශ්විද්‍යාලයේ උගන්වමින් සිටි කාලයේ දී විවිධ ඉංග්‍රීසි නාට්‍ය නිර්මාණ අනුවර්තනය කර නිෂ්පාදනය කරන ලදී. ඒ අතර,
    - හැංගි හොරා(The Importance of Being earnest)
    - මගුල් ප්‍රස්තාව(The proposal)
    - වළහැඩියා(The Bear)
    - මැනේජර්(Manager)
- විශ්වවිද්‍යාල ඉංග්‍රීසි නාට්‍ය කලාව රජයන සමයක 1940 දශකය වන විට විශ්වවිද්‍යාල තුළ සිංහල නාට්‍ය කලාවේ උද්යෝගයක් ඇති කිරීම සඳහා මෙතුමන් මහගු කැපකිරීමක් සිදුකරනලදී.
- සරච්චන්ද්‍රයන්ගේ බලවත් උනන්දුව ඇතිව **"සිංහල නාට්‍ය මණ්ඩලය"** නම් සංවිධානය ක් 1951 දී බිහි විය.මෙම සංවිධානය මගින් පළමු වරට ඉදිරිපත් කරන ලද්දේ සරච්චන්ද්‍රයන්ගේ නිෂ්පාදනයක් වූ **"බහින කලාව හෙවත් සංස්කෘතික කොමසාරිස් "** නැමැති ජවනිකා දෙකකින් යුත් නාට්‍යකි.
- මෙය සරච්චන්ද්‍රයන්ගේ මුල්ම නිෂ්පාදනයක් වූ අතර **1951 දී කොළඹ ජෝර්ජ් රාජ** ශාලාවේදී වේදිකා ගත විය.
- අනතුරුව මෙම නාට්‍ය මණ්ඩලයේ දෙවන නිෂ්පාදනය වශයෙන් සරච්චන්ද්‍රයන් විසින් ලියන ලද **"පබාවතී" 1951** දී රඟ දක්වන ලදී . "පබාවතී" නාට්‍ය විචාරකයන්ගේ දෝෂ දර්ශනය ට ලක්වන්නට විය.
- මෙම පබාවතී නාට්‍ය දේශීය නාඩගම් ,බටහිර ස්වාභාවික හා සංස්කෘත යන සම්ප්‍රදායන් තුනේම සංකලනයක් වූ නිසාම මෙය අර්ධ ස්වාභාවික ශෛලියට අයත් නාට්‍යක් විය.

- මෙලෙස සිය නාට්‍ය මංපෙත තුල ගමන් ගන්න එදිරිවීර සරච්චන්ද්‍රයන් කලක් යාමට මත්තෙන් වෙනස් මංපෙතක් ඔස්සේ තම ගමන ආරම්භ කරන්නට විය. එනම් දේශීය නාට්‍ය කලාවක් ගොඩනැංවිය හැක්කේ බටහිර නාට්‍ය අනුකරණයෙන් නොව, දේශීය සම්ප්‍රදායන් වේ නම් ඒවා අධ්‍යනය කිරීමෙන් බව මෙතුමන්ගේ මතය විය.
- ඒ ඔස්සේ යමින් උඩරට ,පහතරට ,සබරගමු ගම්බදව පැවති යක්,තොවිල්,බලි තොවිල්, කංකාරි කෝලාම් ,සොකරි,කෝලම් යන ගැමි දේශීය නාටක යනාදිය අධ්‍යනය කරමින් ගම් නියම් ගම් සිසාරා සංචාරය කරන්නට විය. මේ අතරදී මෙම දේශීය කලාවන් ගැඹුරින් අධ්‍යනය කල මෙතුමා තව දුරටත් අධ්‍යනය කටයුතු උදෙසා ඉන්දියාව ,තායිලන්තය ,ජපානය ,චීනය වැනි රටවල් වල ද සංචාරය කර සිංහල නාට්‍ය කලාව ගොඩනැංවීමට පෙරදිග සංස්කෘතින් තුලින් යම් පිටුවහලක් ලැබේද යන්න පිලිබඳවත් පර්යේෂණ කරන ලදී.
- මෙකී සියලු පර්යේෂණයන්ගේ ප්‍රතිඵලයක් වශයෙන් **1954 දී, "සිංහල ගැමි නාටකය"** නම් ග්‍රන්ථය එළිදක්වන ලදී.
- මෙම කාල වකවානුව තුලදී නැවත " සිංහල නාට්‍ය මණ්ඩලය " විසින් 1955 දී සරච්චන්ද්‍රයන්ගේ **ස්වතන්ත්‍ර** නාට්‍යයක් වන **" වදින්න ගිය දේවාලය"** නම් නාට්‍ය නිෂ්පාදනය කරන ලදී.
- මෙම නාට්‍ය තුළ ද යම් යම් දුර්වලතා මතු වූ අතර මෙම කාලවකවානුව සිංහල නාට්‍ය කලාවේ දුර්වල අවධියක් බවට පත් විය.
- දේශීය නාට්‍ය කලාව සම්බන්ධයෙන් ඔහු මෙසේ ප්‍රකාශ කළේය.

  **" දේශීය නාට්‍ය සම්ප්‍රදායක් ගොඩනැගීමට නම් අප නව මඟක් ඔස්සේ ගමන් කළ යුතු යැයි සිතමි".....**

- ඒ අනුව දේශීය නාට්‍ය කලාවක් පිළිබඳ සරච්චන්ද්‍රයන්ගේ සිහිනය සැබෑ කරමින් 1956 දී නොවැම්බර් 3 වන දින කොළඹ ලයනල් වෙන්ට්ඩ් අනුස්මරණ ශාලාවේදී **" මනමේ"** නාට්‍ය වේදිකා ගත විය.
- මෙම නාට්‍ය සිංහල කලාවේ මහත් පෙරලියක් කිරීමට සමත් වූ විශිෂ්ට නාට්‍ය නිර්මාණයක් විය. මෙම නාට්‍ය සඳහා **දේශීය සින්දු නාඩගම් රාගතාල, ගමන්තාල,ඇඳුම් පැළඳුම්, මද්දලය** ආදී වශයෙන් වූ විවිධ ආභාෂයන් අන්තර්ගත කර ඇත.




- මනමේ නාටකය පිළිබඳව ඔහුවිසින්ම විස්තර කරන ලද්දේ මේ අයුරින් ය.

  **"මනමේ කතාව කෝලම් සම්ප්‍රදායෙන් හා කවි වලින් මෙතෙක් කල් ගම්බදව රඟ දැක්වුනු නමුදු ,එය නාඩගම් සම්ප්‍රදාය අනුව රඟ දැක්වීම සඳහා රචනා කරන ලද පලමුවන වතාව මේ ය.... "**

- මනමේ නාට්‍ය නිෂ්පාදනය වීමෙන් **ශෛලිගත (නාට්‍ය ධර්මී)** යැයි හැඳින්වූ සිංහල නාට්‍ය කලාවක් බිහි විය.
- මනමේ නාට්‍යයෙන් පසුව පහත නාට්‍ය එදිරිවීර සරච්චන්ද්‍ර සූරීන් විසින් නාට්‍ය මණ්ඩලය වෙනුවෙන් නිෂ්පාදනය කරන ලදී.
  - 1958 දී - "රත්තරං"
  - 1958 දී - "කදාවළලු"
  - 1959 දී - "එලොව ගිහින් මෙලොවට ආව"
  - 1960 දී - "වෙල්ල වැහුම්" නැමැති හාස්‍ය ජනක නාට්‍යය.
- කවර දේශීය නාට්‍ය සම්ප්‍රදායකට වුවද ගායන, වාදන හා නර්තන පදනම් විය යුතු බව පිළිගත් සරච්චන්ද්‍රයන් නාඩගම් සම්ප්‍රදාය පදනම් කොටගෙන කාලෝචිත ලෙස සකස් කොට **(1956) මනමේ නාටකය** හා **(1961) සිංහබාහු** නාටකය නිෂ්පාදනය කළේය. නාඩගම් සම්ප්‍රදාය පදනම් කොට ගෙන ඔහු විසින් නිපදවන ලද්දේ මෙම නාට්‍ය දෙක පමණි.
- සිංහබාහු නාට්‍යද මනමේ මෙන් ම ප්‍රේක්ෂක ජනතාව අතර ජනප්‍රිය වූ අතිවිශිෂ්ඨ නාට්‍යක් බවට පත්විය.
- මනමේ නාට්‍ය මෙන්ම සිංහබාහු යන නාට්‍ය අද වනවිටත් ඒ ජනප්‍රිය තාවය දැරීමට සමත් වී ඇත.





- නමුත් ඔහු විසින් රචිත අනෙකුත් නාට්‍ය සඳහා නාඩගම් සම්ප්‍රදායෙන් බැහැරව ගායන, වාදනය, නර්තන ඇතුලත් ශෛලිගත සම්ප්‍රදායක් අනුගමනය කෙරිනි.
- මෙම සෑම නිර්මාණයක් ම නව දෘෂ්ටියක් හා අපූර්වත්වය කුළු ගැන්වෙන අයුරින් ඉදිරිපත් කිරීමට මෙතුමන් සමත් විය.පුරාණෝක්ති,ජන කතා, ජාතක කතා මෙන්ම වර්තමාන සමාජ සංසිද්ධි ද භාවිත කරමින් නාට්‍ය රැසක් නිර්මාණය කර ඇති අතර එම නාට්‍ය අංශ 4 ක් යටතේ වර්ග කර දැක්විය හැක.

- **අනුවර්තන නාට්‍ය** (වෙනත් භාෂාවලින් ලියැවුණු නාට්‍ය)

  - මුදලාලිගේ පෙරළිය ( Le Bourgeois Gentilhomme) - 1943
  - කපුවා කපොති(The Marriage) - 1945
  - හැංගි හොරා( Importance of being earnest) - 1949
  - වලහා( The Bear) - 1951
  - මගුල් ප්‍රස්තාව ( The Proposal ) - 1951
  - මැනේජර් ( The Anniversary ) - 1951
  - වෙද හටන ( නියුමාල් ජුබාල් සමඟ)(Le malade Imaginaire) - 1953

- **ජාතක කතා ඇසුරින් නිෂ්පාදනය කළ නාට්‍ය**

  - පබාවතී - කුස ජාතකය
  - මනමේ- චුල්ල ධනුද්ධර ජාතකය
  - වෙස්සන්තර - වෙස්සන්තර ජාතකය
  - කදාවළලු - සේරිවාණිජ ජාතකය
  - මහාසාර - මහාසාර ජාතකය
  - ලෝමහංස - මහා පුදුම ජාතකය
  - බව කඩතුරා- ස්වර්ණ හංස ජාතකය

- **පුරාවෘත හා වෙනත් කතා ආශ්‍රයෙන් නිෂ්පාදනය කළ නාට්‍ය.**

  - ඒකට මට හිනා හිනා
  - රත්තරං
  - වෙල්ලවැහුම්
  - එලොව ගිහින් මෙලොව ආවා
  - සිංහබාහු
  - හස්ති කාන්ත මන්තරේ
  - ප්‍රේමතෝ ජායතී සොකෝ

- **ස්වතන්ත්‍ර නාට්‍ය**

  - බහින කලාව
  - මටපුළුවේ ගෙවල් බිදිලා
  - වදින්න ගිය දේවාලය

**ඇගයීම:**

1. සිංහල නාට්‍ය කලාවට එදිරිවීර සරච්චන්ද්‍රයන් අතින් සිදු වූ සේවය සහ ඔහු විසින් නිෂ්පාදය කෙරුණු නාට්‍ය පිළිබඳව කරුණු ගොනු කොට ප්‍රශ්නෝත්තර සංග්‍රයක් සකස් කරන්න.

## ➢ දයානන්ද ගුණවර්ධන



මෙරට ජන විඥානය පසක් කර ගනිමින් දේශජ උරුමයකින් යුත් ස්වතන්ත්‍ර නාට්‍ය කලාවක් ස්ථාපිත කිරීම සඳහා විශිෂ්ට පර්යේෂකයෙකු ලෙස මහැදුරු සරච්චන්ද්‍රයන්ගෙන් පසු නව ගමන් මගකට පිළිපන් නාට්‍ය වේදියා ඔහුය.නාඩගම් කලාවෙන් ඔබ්බට මෙරට ජන ආර සහ ඒ සමග බැඳුන ප්‍රහසන රීතිය සියුම් ලෙස අධ්‍යනය කරගත් ඔහු අපගේ ඉතිහාසය සැරසූ ජන කතා හා ජනශ්‍රැති ජීවමාන කිරීමට තම නිර්මාණ පෞරුෂය යොදාගත්තේය.

- ජන සාහිත්‍ය රංගනයට යොමු කරනවිට යොදාගතයුතු රංග ශෛලීය කුමක්දැයි ඔහුගේ සූක්ෂම අවධානය ට යොමු වූ ආකාරය ඔහුගේ නිර්මාණය න් අධ්‍යනය කිරීමෙන් පසක් කර ගත හැක.
- සිංහල නාට්‍ය කලාවේ ප්‍රගමනයට දායක වූ සුවිශේෂ නාට්‍යකරුවෙකු වශයෙන් දයානන්ද ගුණවර්ධනයන් අපූර්වත්වයෙන් යුතු සිදිධි ගැලපීමේ අති දක්ෂයකු විය.
- දයානන්ද ගුණවර්ධනයන් දේශීය තොවිල් සම්ප්‍රදායට මෙන්ම සොකරි, කෝලම් වැනි දේශීය ගැමි නාටක සමග තදබල ලෙස බද්ධව සිටි අයෙක් බව ඔහුගේ නාට්‍ය නිර්මාණය න් දෙස සියුම්ව අධ්‍යනය කිරීමෙන් අපට අවබෝධ වේ.
- **1961** දී දයානන්ද ගුණවර්ධනයන් අතින් නිෂ්පාදනය කරන ලද **"නරිබෑනා"** නාට්‍ය ප්‍රකට ජන කතාවක් වස්තු විෂය කර ගනිමින් නිර්මාණ වූවකි.
- දයානන්ද ගුණවර්ධනයන් කොතෙක් දුරට මෙම දේශීය ගැමි නාට්‍ය,ජනවහර කෙරේ බැදි සිටි අයෙක්ද කියතොත් ඒ බව මෙම "නරිබෑනා" නාට්‍ය දෙස අවධානය යොමු කිරීමෙන් අපට පැහැදිළි වේ.





- "නරිබෑනා" නාට්‍ය තුළ හාස්‍ය රසය, විනෝදය මෙන්ම උපහාසය ද දක්නට ලැබේ. තවද **ගැමි ගී ,රබන් පද,සවිදම්, බම්බු සංවාද** නිර්මාණයේ මෙන්ම රංග රචනා කිරීමේ දී භාවිතා කර ඇත.
- විශේෂයෙන් සඳහන් කළ යුතු කරුණක් නම්, මෙම නාට්‍ය ශෛලිගත සම්ප්‍රදායට අනුව නිර්මාණය වී තිබීමයි.ප්‍රහසනයන් ලෙස සැලෙකෙන මෙහි නැටුම්, ගැයුම්, වැයුම්, සංවාද ආදිය මෙන්ම රගපෑම්, වේෂනිරූපණය ආදිය ද විනෝදාස්වාදය ඉස්මතු වන පරිදි සැකසී ඇත.
- **1961** අවදියේ දයානන්ද ගුණවර්ධනයන් අතින් නිර්මාණයවන්නට යෙදුන **"පරාස්සයා"** යන නාට්‍ය ද ගැමි ජන කතාවක් ආශ්‍රයෙන් නිර්මාණය විය.
- එසේම **පිංගුත්තර (1961)** නාට්‍ය ද ශෛලිගත සම්ප්‍රදාය ට අනුව නිර්මාණය වුවද එය එතරම් සාර්ථක නාට්‍යයක් නොවිණි.
- **1960** දී **"කාමරේ පොරේ"** නැමති තවත් නාට්‍යක් මෙතුමන් විසින් වේදිකා ගත කර ඇත.
- මෙය **ඉංග්‍රීසි නාට්‍ය කරුවෙකු** වන **Jhon Maddison Morto** ගේ **"Box and Cox"** යන නාට්‍යයේ අනුවර්තනය ක් විය.
- මෙයද හාස්‍ය ජනක නාට්‍ය නිර්මාණයක් ලෙස වේදිකාගත කර ඇති අතර මෙහි මුල් වේදිකාගත කිරීමේ දී කිසිම නාට්‍ය ගීයක් අන්තර්ගත වී නොමැත.
- මෙම කාලවකවානුව තුළ දීම **"ඇමති පට්ටම"** නම් වේදිකා නාට්‍ය ද වේදිකා ගත වූ අතර මෙය **Bulgarian drama -" Golemanov"** නම් සාහිත්‍ය රචකයාගේ අනුවර්තන නාට්‍ය ක් විය.
- ගැමි ශෛලීන් ට අමතරව විදේශීය නාට්‍ය රචකයන් ගේ විවිධ නාට්‍යන්ද අනුවර්තනය කරමින් නාට්‍ය නිර්මාණකරනයේ නියැලුනු මෙතුමන් **1963 දී" බක්මහ අකුණු"** නම් නාට්‍ය නිර්මාණය කරන ලදී.
- මේ සඳහා මූලික වූයේ ප්‍රංශ නාට්‍යයකරුවෙකු වූ **කැරන්ඩ් බෝමාෂේ** ගේ **The Marriage of figaro** ( ෆිගාරෝගේ විවාහය) නම් නාට්‍යයයි.
- මෙම නාට්‍යයේ අනුවර්තනය ක් වන "බක්මහ අකුණු" හාස්‍ය රසයෙන් යුක්ත වූ අපූර්ව නාට්‍ය නිර්මාණය ක් විය.
- මෙම නාට්‍ය නිර්මාණය සමඟ සිංහල නාට්‍ය වේදිකාවට ප්‍රථම වරට කැරකෙන වේදිකාව **Revolving stage** හඳුන්වා දෙන ලදී.1963දී මෙම නාට්‍ය **ලුම්බිණි රංග ශාලාවේදී** රංග ගත කරන ලදී.
- ධනපති පැලැන්තියේ පවුල්වල රහසිගතව සිදුවෙන නොයෙකුත් පහත් ක්‍රියා උපහාසයට ලක්කරන මෙම ප්‍රහසනයක් විය.මෙම නාට්‍යයේ ගීත රචනය දයානන්ද ගුණවර්ධනයන් අන්තිම රචනා වී ඇත.
- **1965** දී දයානන්ද ගුණවර්ධනයනගේ **"ජසයා හා ලෙන්චිනා"** කෝලම් නාට්‍ය කලාවේ එන ජස කෝලම හා ලෙන්චිනා යන චරිත ද්විත්ව අලලා සිදුවන ගැටුම්කාරි අවස්ථාවන්,සිදුවීම් හස්‍ය රසයෙන් යුතුව නිර්මාණය වූ වේදිකා නාටයක් විය.
- මෙම වේදිකා නාට්‍ය සඳහා කෝලම් සම්ප්‍රදාය මූලික වස්තු විශය වී ඇති අතර එකී සම්ප්‍රදායන් මැනවින් අවබෝධ කරගනිමින් නාට්‍ය මූලධර්මයට අනුගතව වේදිකාවට ගැලපෙන පරිදි නිෂ්පාදනය කර ඇත.

- මෙම වර්ශයේදිම නිර්මාණය වූ **(1965) "ජීවන වංචාව හෙවත් ඉබිකට්ට"** නම් නාට්‍ය නිර්මාණය උසස් නිර්මාණයක් ලෙස මත පල කර ඇත.තම සිතට එකගව අවංකව ජීවත්වෙන ලිපිකරුවකු දෙපාර්තමේන්තුවෙන් ණය මුදලක් ලබා ගැනීමට ගොස් මුහුණ දෙන අභාග්‍ය සම්පන්න සිදුවීම් අළලා සමකාලීන සාමාජයේ මිනිසුන් ට අත්වන සිදුවීම් හස්‍ය ජනක ලෙස ඉදිරිපත් කිරීමට දයානන්ද ගුණවර්ධනයන් මෙහිදී සමත් වී ඇත.
- මාතර යුගයේ ජීවත් වූ ප්‍රකට කිවිදිය ක වන ගජමන් නෝනාගෙ චරිතය අලලා නිෂ්පාදන **"ගජමන් පුවත" 1975** දී නිර්මාණය විය.






- පැරණි ලේඛන පරිහරණය කරමින් "නෝනාගම" වැනි කිවිදියකට සම්බන්ධ ප්‍රදේශවල සැරිසරමින් ලබාගත් සහිත්‍ය තොරතුරු ආශ්‍රයෙන් මෙම නාට්‍ය නිර්මාණය කර ඇත. ඒ අනුව මෙම නාට්‍ය **"වාර්තා රංග ශෛලීය"** ලංකා වට හදුන්වාදුන් නාට්‍යයක් ලෙස ඉතිහාසය ගත වන්නකි.
- වාර්තා රංග ක්‍රමය හඳුන්වා දෙමින් නැවතත් **1983 දී "මධුර ජවනිකා"** නම් නාට්‍ය නිර්මාණය කරන ලදී.



- රාවණ යුගයෙන් පටන් ගෙන ඩුබායි යන වංශවති දක්වා ලංකා ඉතිහාසය යේ රසමුසු තැන් ඉදිරිපත් කරමින්, ලාංකික ජනශ්‍රැතිය පාදක කරන ගනිමින් නිර්මාණය වූ මෙහි අපේ රටට පැමිණි විදේශිකයන් හා ඔවුන්ගේ බලපෑම ආදිය මූලික කර ගනිමින් මෙම නාට්‍ය නිෂ්පාදනය කර ඇත.

- ○ රාවනාගෙ කෝපය
- ○ විභීෂණගේ කාලකණිය
- ○ සින් බැඬිගේ චාරිකාව
- ○ කුවේණියගේ දිවිදොස
- ○ මූණ දෙකේ කෝලම
- ○ කන්ද උඩරට විලාපය ...

- ආදිය වශයෙන් ජවනිකා වේදිකාවට ගෙන එනු ලබන්නෙ කථකයන් දෙදෙනකු මාර්ගයෙනි.
- එසේම බෞද්ධ අධ්‍යාපන පුනරුදය සඳහා ගෙන ගිය ඓතිහාසික අරගලය හා කැපකිරීම විදහා දැක්වෙන **"ආනන්ද ජවනිකා" 1986 දී** වාර්තා රංග ක්‍රමයට ට අනුව නිර්මාණය කරන ලදී.

දයානන්ද ගුණවර්ධනයන් අතින් නිෂ්පාදිත මෙම නාට්‍ය නිර්මාණයන් දෙස මෙලෙස විමර්ශනාත්මකව අවධානය යොමු කිරීමෙන් අවබෝධ වූ එක් කරුණක් නම් මොහු නාට්‍ය නිර්මාණයේදී නොයෙකුත් පර්යේෂණාත්මක අත්හදා බැලීම් සිදුකල බව හදුනාගෙන ඇති අතර නව රංග ක්‍රම ලාංකික වේදිකාවට හදුන්වාදුන් පුද්ගලයෙක් ලෙස අදටත් කතා බහට ලක් වී ඇත.

**ඇගයීම:**

1. දයානන්ද ගුණවර්ධනගේ නාට්‍යවල අන්තර්ගත් ජනප්‍රිය ගීත ඇතුලත් ගොනුවක් සකස් කරන්න.

## ➢ <u>ගුණසේන ගලප්පත්ති</u>



**"එපා පුතේ මූදු යන්නට රෑ දවාලේ හිතුමතේ..**

**ඕරුව යන්නෙ මකර කටටයි සුලන් පහරට අහුවෙතේ......."**

සිංහල නාට්‍ය ගමන් මගෙහි නාට්‍ය කලාව සුපෝෂනය කල තවත් එක් නාට්‍යකරුවෙකු ලෙස ගුණසේන ගලප්පත්ති ශූරින් පෙන්වාදිය හැක. 1956 දී සරච්චන්ද්‍රයන්ගේ" මනමේ " නාට්‍ය සමඟ සිංහල නාට්‍ය වංශ කථාවේ සමාරම්භය සිදුවෙද් දී **1957** දී ගුණසේනගේ **"සඳකිඳුරු** "නාඩගම නිර්මාණය කරමින් එකී ගමන් මඟට ශක්තියක් වන්නට හැකි විය.සිංහල නාට්‍ය කලාවේ පෝෂණයට විවිධ අයුරින් දායකත්වය සැපයීමට ඔහු සමත් විය.

- ගුණසේන ගලප්පත්ති ගේ මෙම ගමන ආරම්භ වන්නෙ **1956 දී 'සත්ත්ව කරුණාව'** නම් නාට්‍යයෙනි. මෙය කෝට්ටෙ ආනන්ද ශාස්ත්‍රාලීය සෙසු පිරිස සමග කරන ලද නිෂ්පාදනය ක් විය.
- එසේම මෙතුමන් ගුවන් විදුලි නාට්‍ය රචකයෙකු වශයෙන් ද කටයුතු කර ඇත.
- **1957 දී "සඳ කිඳුරු"** නාට්‍ය නිෂ්පාදනය සියලු දෙනාගේ අවධානය ගැනීමට සමත් වූ නාට්‍ය නිර්මාණය ක් විය.
- මනමේ මෙන්ම දේශීය මුල් සොයා ගිය ගුණසේන ගලප්පත්ති ගේ 'සඳ කිඳුරු' **" කවි නාඩගම් "** ශෛලීය අනුව යමින් කරන ලද නිෂ්පාදනය කි. එයට ආශ්‍රය කරගනු ලැබුවේ පරිවෘත බල මහිමය කියවෙන **" චන්ද කින්දර "** ජාතක කතාව යි.සඳකිඳුරු මේ ගනයේ ප්‍රථම නාට්‍ය වශයෙන් සැලකිය හැක . ආචාර්ය සරච්චන්ද්‍ර මනමේ නිෂ්පාදනය කලේ ( 1956) වැඩි වශයෙන් " සින්දු නාඩගම් ආශ්‍රයෙන් වුවද ගුණසේන ගලප්පත්ති සඳකිඳුරු නිෂ්පාදනය කලේ " කවි නාඩගම් " වලින් ආභාසය ලබමිනි.
- දේශීයත්වය සොයා ගිය ගුණසේන ගලප්පත්ති එතනින් නොනැවතී විදේශීය නාට්‍ය නිර්මාණ වල ආභාසය යොදාගනිමින් නාට්‍ය කරනයේ යෙදෙන්නට විය. 1962 දී කෝට්ටේ ආනන්ද ශාස්ත්‍රාලයේ සිසුන් සමඟ එක්ව **ඇන්ටන් චෙකෝෆ්ගෙ The bear** නම් නාට්‍ය අනුවර්තනය කරමින් **"වලහැඩියා"** යම් නාට්‍ය නිෂ්පාදනය කරන ලදී .
- එම වර්ශයේදි ම ඔහු **ස්පාඤ්ඤ ජාතික ගාර්ෂියා ලෝකාගේ " යෙර්මා " ( Yerma)** නැමැති නාට්යයේ අනුවර්තනය ක් ලෙස ගෙන නිෂ්පාදනය කරන්නට යෙදුණු **"මුහුදු පුත්තු"** නාට්‍ය මෙරට සිංහල නාට්‍ය වංශයේ කැපී පෙනෙන නාට්‍ය ක් බවට පත්විය.
- ධීවර ගම්මානයක් පසුබිම් කොට ගෙන නිර්මාණය වන මෙම නාට්‍යයෙන් කියවෙන අනුවේදනීය කතාපුවත විශිෂ්ත්වයට පත්වන්නෙ එම සැම ප්‍රේක්ෂකයකුම ස්වාත්ම අද්දැකීමක් ලෙස විඳින නිසාය.

ධීවර ගම්මානයක ජීවත් වෙන " සරා" වද ගැහැනියක් යැයි සමාජයෙන් ගැරහුම් ලබයි. මේ අතර " තේගිරිස්ගේ" සොහොයුරු " දියෝනිස් "මැදිහත් වී "සරා" වද ගැහැණියක් නොවන බව ඔප්පු කරයි. පසුව මේ බව දැනගත් තේගිරිස්ගේ දරුවා මරා දැමීමෙන් පසු පවුලේ සතුට සමගිය නැවත දෙදරා යයි.

❖ **මුදු පුත්තු නාට්‍යයේ සාරා ලෙස සෝමලතා සුබසංහ රඟපෑ ජවනිකාවක්**



- " මුහුදු පුත්තු" නාට්‍ය නිෂ්පාදනය ගාර්ෂියා ලෝකාගේ ආභාශය ලැබුවද තම අභිලාෂය වූයේ එකී විශ්වමය තේමාවට හැකිතරම් පුළුල් ( විශාල දැනුමක් ) දෘෂ්ටියක් දීම බව ගුණසේන ගලප්පත්ති සඳහන් කරයි.
- ඒ අනුව මෙතුමන් මෙරට සමාජීය ආගමික පසුතලය මෙන්ම සමාජය තුළ මුල් බැස ගත් ඇදහිලි හා අන්ධ විශ්වාස න්ද මෙකී මෙරට පොළවෙන් මතු වූ දේශීය නිෂ්පාදනය ක් තරමටම සාර්ථකත්වය ට පත් විය. ඒ අනුව මුහුදු පුත්තු නාට්‍ය ඇතැම් පරිවර්තන අනුවර්තන නාට්‍ය අතරින් සාර්ථක නිෂ්පාදනය ක් විය.
- ඒ බව සුගතපාල ද සිල්වා මහතා මුහුදු පුත්තු නාට්‍ය පිළිබඳව විචාරයක් යෙදෙමින් මෙසේ ප්‍රකාශ කරයි.

**"ලෝකයේ නාට්‍යයකින් අදහස උපුටා ගත් පමනින් මුහුදු පුත්තු බාල කොට තැකීමට ඇතැමුන් උත්සාහ කිරීම අසාධාරණ වේ. ගුණසේන ගලප්පත්ති ශෛලිගත සම්ප්‍රදායෙන් හොඳ ආභාශයක් ලද නාට්‍යකරුවෙකු වේ. එසේම මලින් මලට ගොස් රොන්ගන්නා මී මැස්සා ඒවා මී පැනි වශයෙන් ආපසු දෙන බවද සුගතපාල ද සිල්වා මහතා ප්‍රකාශ කර ඇත.**

- එසේම **1963** වර්ශයේදි නිර්මාණය වූ ස්වතන්ත්‍ර නිර්මාණය ක් ලෙස එළි දකින **"දේවතා එළි "** නාට්‍ය නිර්මාණය සඳහා **බර්ටෝල් බ්‍රෙෂ්ට්** ගේ **The good woman of setzuan** යන ග්‍රන්ථය ආභාසය කර ඇතැයි විචාරක මතය වේ.
- ඒ අනුව මෙම නාට්‍යය ශෛලිගත සම්ප්‍රදාය ස්වාභාවික සම්ප්‍රදාය සමඟ මිශ්‍රකිරීමෙන් නිර්මාණය කරන ලද පෙර අපර දෙදිග සම්මිශ්‍රණයක් වශයෙන් පෙන්වා දිය හැක.
- **1964** දී ස්වතන්ත්‍ර නිර්මාණය ක් ලෙස **"දැස නිසා"** නාට්‍ය නිර්මාණය විය.

- දේශපාලනත්මක තේමාවක් සහිතව එළිදකින **1969 දී** ඔහු **ප්‍රංශ ජාතික ජීන් පෝල් සාත්රේගේ " ලේ මාසලේ" ( Dirty Hard )** ඇසුරින් **"ලියතඹරා"** නාට්‍ය නිර්මාණය කරන ලදී.
- දේශීය සංස්කෘතියෙ හි දක්නට ලැබෙන කුටුම්බියේ අන්නෝන්‍ය සම්න්ධතාවය පිළිබිඹු කරන මෙය ද ප්‍රේක්ෂක විචාරයට ලක්වූ ඔහුගේ තවත් අනුවර්තන නාට්‍යයකි.
- අත්භූත කතා පුවතක් රැගත් **"මාහේනේ රීරි යකා"**යන නාට්‍ය ද ගුණසේන ගලප්පත්ති මහතා විසින් නිර්මාණය කරන ලද්දකි.
- විවිධ පර්යේෂණාත්මක අත්හදා බැලීම් කරමින් නාට්‍ය කරනයේ යෙදුන මොහු සරච්චන්ද්‍රයන්ගේ ප්‍රාරම්භක නාට්‍ය වල චරිත නිරූපණයෙන් ආරම්භ වී ඔහුගේ බොහෝ නිර්මාණ වලට දායකත්වය ලබාදෙමින් ක්‍රමයෙන් සිංහල නාට්‍ය ගමන් මගෙහි ආරම්භක නාට්‍ය නිර්මාණකරුවකු වශයෙන් නාට්‍ය කලාවෙ සුපෝෂනය සඳහා ඔහුගෙන් වූ දායකත්වය අමරණීය වන්නේය.

**මුහුදු පතුල යට ඉදලා...**

**මුතු ඇටයක නිදි කරවා....**

**පෙන කැටියක පාකරලා....**

**මගෙ දෝතට පුතු ආවා.....**

**මුහුදු පුත්තු ( පසුබිම් ගායකයා)**

## ඇගයීම :

1. ගුණසේන ගලප්පත්තිගේ මුදු පුත්තු නාට්‍යයේ කතා වස්තුව කතනදර්යක් ලෙස ලියා රූප මඟින් එහි අවස්ථා හා සිද්ධි මුලක් , මැදක්, අගක්, සහිතව චිත්‍රයට නගන්න.

# ➢ <u>රංජිත් ධර්මකීර්ති</u>



**ස**ම්මානලාභී නාට්‍ය රචකයෙකු ,අධ්‍යක්ෂක වරයෙකු මෙන්ම නවකතා කරුවෙකු ,පරිවර්තකයෙකු ශාස්ත්‍රීය ග්‍රන්ථ සම්පාදකයෙකු වශයෙන් විවිධ ක්ෂේත්‍ර ඔස්සේ සිය කුසලතාවයන් එළිදැක්වූ මොහු නමින් ධර්මකීර්ති නම් විය. මොහුටම ආවේණික වූ ඉතා සිත් ගන්නා සුලු රචනා ශෛලියක් ඔහු සතු විය ඔහුගේ නවකතා, කෙටිකතා මෙන්ම පරිවර්තන ග්‍රන්ථයන් පිළිබඳ ව අවධානය යොමුකිරීමෙ දී ඔහු විසින් ඔහුටම ආවේණික වූ පැහැදිලි රචනා ශෛලියක් ඇති බව පෙනී යයි. ඒ බව ඔහුගේ " **ගිනි සිළුවක සද එළිය** " නම් **නවකතාව** තුළින් මොනවට පැහැදිලි වේ. එපමනක් නොව නාට්‍ය රචනය මෙන්ම නිෂ්පාදනය කෙරෙහිද සුවිශේෂී කුසලාතවයක් දැක්වූ මෙතුමන් විවිධ ක්ෂේත්ර ඔස්සේ නාට්‍ය රචනා කර ඇත.

- 1965 දී නැංගුරම් නිර්මාණය කරන ඔහු ඒ මගින් සිය අපේක්ෂා වන් මුදුන්පමුනුවා ගත නොහැකිව මනෝ ලෝකයක ජීවත්වන පුද්ගලයෙකු ගේ චර්යා පද්ධතිය වේදිකාව මත නිරූපණය කලේය.
- තවද ඇන්ටන් චෙකෝෆ්ගෙ " **චෙරි වත්ත** " ඇසුරු කර ගනිමින් ස්වතන්ත්‍ර නාට්‍ය නිර්මාණය ක් සිදුකරන ලදී.
- **1978 දී** නිර්මාණය වූ **"අංගාරා ගඟ ගලා බසී"** නාට්‍ය ප්‍රේක්ෂක පිරිස් අතර කතාබහට ලක් වූයෙ එහි වූ මියුරු සංගීතයන් සමඟ ය. **කේමදාස සූරීන්** විසින් මෙම නාට්‍ය නිර්මාණය සඳහා සංගීතය නිර්මාණය කරන්නට විය.
- එසේම සිංහල යථාර්ථවා දී එනම් ස්වාභාවික නාට්‍ය කලාවේ නොමැකෙන මග සලකුනක් සනිටුහන් කිරීමට **1982** දී නිර්මාණය වූ **"මෝදර මෝල"** නම් නාට්‍ය සමත් විය.
- මෙහිදී සාමාන්‍යයෙන් නාට්‍යකරුවන් නොදුටු තේමාවක් ආශ්‍රය කරගෙන සර්වකාලීන අත්දැකීමක් ප්‍රේක්ෂකයා වෙත ගෙන ඒමට රංජිත් ධර්මකීර්ති මහතා සමත් වී ඇත. " මෝදර මෝල" නාට්‍ය පිළිබඳව සටහනක් පහත දැක්වේ.

**" මෝදර මෝල නාට්‍ය ලිවීමේදී එය තල දෙකක් මත දිස්වෙන්නක් සේ සැකසීමට මා උත්සාහ කල බව මෙහිලා සඳහන් කලයුතු යැයි සිතේ. මෙය මෝදර පලාතේ මෝලක් විය හැකි මෙන්ම සංකේත අර්ථයෙන් ගඟක් මුහුදක් එක් වෙන තැනක මෝයක පිහිටි මෝලක්ද වේ.එක් අතකින් මෙය රාලහාමිගේ පවුල හා පවුලේ සාමාජිකයන් අතර පවතින අර්බුදය පාසුබිම් කොටගන්නකි. එතෙක් මෙම චරිත යොදාගෙන ඇත්තේ නියෝජනාත්මක ලෙසින්. "**

**( මෝදර මෝල නාට්‍ය -ප්‍රස්තාවනාව)**

**-රංජිත් ධර්මකීර්ති-**

- ලෝක ධර්මී රංග රීතිය මැනවින් යොදාගනිමින් එක් එක් චරිතයන් සංකේතාත්මකව ඉදිරිපත් කිරීමට මොහු සමත් වී ඇත.
- මෙහි රාලහාමි නම් චරිතය ධනවා දී සමාජ ආර්ථික සබඳතා නියෝජනය කරන්නකි. එසේම ඔහුගේ වැඩිමහල් පුත් **ලක්දාස, ගුණසිංහ, අනෝමා, පියසිරි** යන සෑම චරිතයක් උදෙසා ම සමාජයේ එක් එක් ප්‍රවනතා නියෝජනය කරන අයුරින් යොදා ඇත. එසේම ඒ ඒ චරිතයට අනුකූල වන පරිදි සංවාද භාෂාව පිළියෙල කර ඇති ආකාරය ප්‍රසංසනීයය. පවතින සමාජ යථාර්ථය ග්‍රහනය කොටගෙන එවකට **මෝදර මෝල** නාට්‍ය වඩාත් අර්ථවත් නාට්‍යක් බවට පත්වී ඇත.
- මෝදර මෝල නාට්‍යයෙන් අනතුරුව**1991දී** නිර්මාණය වූ **'මේස'** නාට්‍ය ද අර්ථසම්පන්නවූ නාට්‍ය ක් ලෙස සියලු දෙනාගෙ මන දොල පිනවීමට සමත් විය.
- රුසියානු මහා ලේඛක **පියඩෝර් ඩොස්තවෙස්කි** ගේ ජීවිතයේ සත්‍ය තොරතුරු ඇසුරින් නිර්මිත ස්වතන්ත්‍ර නාට්‍යයක් ලෙස මෙය හැඳින්විය හැක.
- රංජිත් ධර්මකීර්ති අධ්‍යාපනයේ **වඩාත් ප්‍රතිභාපූර්ණ යථාර්ථවාදී නාට්‍යයකරුවා යන විරුදාවලිය ලැබීමට** මේස නාට්‍ය ඉවහල් විය.එනම් පාඨක හද සසල කල හැකි සෞන්දර්යාත්මක අගයකින් යුත් නාට්‍යක් ලෙස මේස නම් කල හැකි නිසා වෙනි.
- මේ අයුරින් සුන්දර නිෂ්පාදනය ක් වූ මේස රංජිත් ධර්මකීර්ති ශූරින්ගෙ උසස්ම නිර්මාණය ලෙස ඇතැම් විචාරකයින් මෙන්ම ප්‍රේක්ෂකයන් විසින්ද සලකනු ලබයි. **සේනක පෙරේරා ,ජයලත් මනෝරත්න ,සුමින්ද සිරිසේන හා මල්කාන්ති ජයසිංහ** යන අය මේ සඳහා රංගනයෙන් දායක වී තිබේ.
- එසේම **1991** වසරේ නිෂ්පාදන වලින් 43 ක් රාජ්‍ය නාට්‍ය තරගය සඳහා ඉදිරිපත් වූ අතර මෙහි අවසාන වටය සඳහා **මේස** නාට්‍යය තේරීපත් වී ඇත.
- මේ අයුරින් සම්මානලාභී **නාට්‍ය රචකයෙකු** වශයෙන් ද **විශිෂ්ට නවකතා රචකයෙකු** වශයෙන් ද විවිධ ක්ෂේත්‍ර ඔස්සේ කුසලාතවයන් දැක්වූ මොහු අප අතර නොමියෙන සදාතනික චරිතයක් බවට පත්වී අවසානය.

  - 1965-නැංගුරම්
  - 1966-මහගෙදර
  - 1973-හස්ති රාජ මහත්තයා
  - 1974- හිරු නැති ලොව
  - 1978- අංගාරා ගඟ ගලා බසී
  - 1982- මෝදර මෝල
  - 1986- වෙරි උයන
  - 1987- ආඩි රූලේ නාඩගම
  - 1990- මේස - 1991 දී මේ සඳහා සාහිත්‍ය සම්මානය දිනාගන්නා ලදී.

ඇගයීම:

රංජිත් ධර්මකීර්ති නාට්‍යවල පිංතූර සොයා කුඩා පොතක් නිර්මාණය කරන්න.

# <u>ශ්‍රී ලංකාවේ නාට්‍ය ශිල්පීන්</u>

## <u>මාලනී රණසිංහ</u>





**යන්නට වේ දැන් සැමියා හැර**

**වන වාසෙන් මේ පුතු  සමගා**

**දරුවන් දෙදෙනා හට සෙත් ලැබෙනා**

**මග ඔස්සේ යා යුතු වන්නේ**

**නොසැලී කිසි මෙම වේලේ......**

- කුඩා කල සිටම ගායනයට රංගනයට එකසේ දස්කම් දක්වපු ඇය එදිරිවීර සරච්චන්ද්‍රයන්ගේ සිංහබාහු නාට්‍යයේ ප්‍රධාන චරිතයක් වන සුප්පා දේවියගේ චරිතයට තෝරා ගන්නා ලදී.
- **සිංහබාහු නාට්‍යයේ ආරම්භයේ සිටම (1961) සිංහබාහු නාට්‍යයේ 'සුප්පා දේවී' නම් චරිතය ඉතාමත් දක්ෂ ලෙස නිරූපණය කිරීමට ඇයට හැකිවිය.**
- ඇය විසින් මෙම චරිතය **1961** සිට **1997** දක්වා අවුරුදු තිස් හයක්, දර්ශනවාර පන්දහසකට වඩා සංඛ්‍යාවක් අඛණ්ඩව රංගනයේ යෙදී ඇත.
- වසර **31** කාලයක් පුරාවට එකම නාට්‍යක  එකම චරිතය රඟපෑම නිමිත්තෙන්  **2002 වර්ෂයේදී ඇයගේ නම ගිනස් වාර්තා පොතේ** සඳහන් විය.
- පසුකාලීනව ඇය **මනමේ නාට්‍යයේ** මනමේ කුමරියගේ චරිතය ද නිරූපණය කරන ලදී.
- අනතුරුව එදිරිවීර සරච්චන්ද්‍රයන්ගේ ම තවත් නාට්‍යයක් වන **1980** දී නිර්මාණය කරන ලද **'වෙස්සන්තර'** නාට්‍යයේ **මන්ද්‍රී  දේවියගේ** චරිතය නිරූපණය කරන ලදී.
- මීට අමතරව ගායනයට දක්ෂතාවයක් දැක්වූ ඇය **'පේමතෝ ජායතී සෝකෝ'** නම් නාට්‍යයේ පසුබිම් ගායනය සඳහා ද දායක වී ඇත.
- මාලනී රණසිංහ, සරච්චන්ද්‍ර ශූරීන්ගේ නාට්‍යය හැරුණු කොට **කේ. බී. හේරත් ගේ සුදු කරල් නාට්‍ය සහ මායාදේවි නාට්‍යයේ  දෙනගම හාමිනේ (දුර්ගා)** ගේ චරිතය නිරූපණය කරමින් එම වර්ෂයේ සාම නාට්‍ය උළෙල සහ රාජ්‍ය නාට්‍ය උළෙල යන නාට්‍ය උත්සව දෙකේ දී ම හොඳම සහය නිළියට හිමි සම්මානය දිනා දිනා ගත්තා ය.
- මීට අමතරව **අඹ යාලුවෝ, මවකගේ ගීතය, දිරිය දුව, තරු පබා, සුදු  අරලිය, සක්ක ගෙදර** යන ටෙලි නාට්‍ය සඳහා ඇය රංගනයෙන් දායක වී ඇත.
- ඇය පූර්ණක කාලීන නිළියක් නොවීය. ඇය ගුරුවරියක ලෙස සේවය කළ අතර පසු පසුකාලීනව විදුහල් විදුහල්පතිවරයකු ලෙස ද සේවය කර ඇත. ඇගේ සේවා  කාලය තුළද දී පවා ඇය රංගන කටයුතුවල නිරත වී ඇත.





## එඩ්මන් විජේසිංහ




**1956** දී මනමේ නාට්‍යයේ ප්‍රථම දර්ශනයේ සිට වර්ෂ ගණනාවක් ම එහි වැදි රජුගේ චරිතය රඟපාමින් මොහු සිය විශිෂ්ට රංගන කුසලතාව දක්වා ඇත.ඒ අතර ම නාට්‍යයේම රාජගුරු ගේ චරිතය ද ඔහු නිරූපණයය කර ඇත. **1958** දී එදිරිවීර සරච්චන්ද්‍රයන්ගේ කදා වළලු නාට්‍යයේ සේරිවාණිජ ගේ චරිතය රඟ පාමින් ඔහු තවදුරටත් ප්‍රේක්ෂක ආකර්ෂණය දිනා ගත්තේය.





## මාක් ඇන්ටනී ප්‍රනාන්දු



**මාක් ඇන්ටනී ප්‍රනාන්දු 1960** දශකයේ බොහෝ දෙනාගේ අවධානයට ලක්වන්නේ සිංහබාහු නාට්‍යයේ සිංහයා ගේ චරිතයට පණ දීම නිසාය. **1961** දී පේරාදෙණිය විශ්වවිද්‍යාලයට ඇතුලත් වූ අතර විශ්වවිද්‍යාලයට ඇතුළත් වූ පළමු වසර තුල දී ඔහුට එදිරිවීර සරච්චන්ද්‍රයන් විසින් නිර්මාණය කරන ලද සිංහබාහු නාට්‍යයේ ප්‍රධාන චරිතයක් රඟපෑමට තෝරා ගන්නා ලදී. සිංහබාහු නාට්‍යයේ ආරම්භක සිංහයාගගේ චරිතය නිරූපණය කිරීමේ අවස්ථාව එදා හිමිවූයේ මාක් ඇන්ටනී ප්‍රනාන්දු වෙතයි.

- **1961** වර්ෂයේදී මෙම නාට්‍ය සිංහල වේදිකාවේ ඉතා සුවිශේෂී ස්ථානයක් හිමි කර ගැනීමට සමත් විය. ඔහු නීති උපාධිය සම්පූර්ණ කිරීමෙන් අනතුරුව 1965 දී විශ්වවිද්‍යාලයෙන් ඉවත්ව ගියේය.

- මුල්කාලීනව මාධ්‍යවේදියකු ලෙස ලේක්හවුස් ආයතනයේ සේවය කළ අතර මාස හයකින් පසුව ඔහු ප්‍රධාන කතෘ ධූරයට පත් විය.
- **1961- 1970** දක්වා කාලය තුළදී දර්ශනවාර 1600 ප්‍රමාණයක කාලයක් නොකඩවා සිංහයාග ගේ චරිතයට පණ පෙවීමට මොහු සමත් විය.
- 1971දී මාර්ක් ඇන්ටනී ප්‍රනාන්දු ලංකාව හැරදා එක්සත් රාජ් රාජධානියට යන අතර ඔහු එහි සේවය කරන ලදී.
- 1993 දී ලංකාවට නැවත පැමිණෙන ඔහු අවසන් වරට සිංහයාග ගේ චරිතයට පණ පොවන්නෙ 1993 දී ලයනල් වෙන්ට් රඟහලේ දී ඉදිරිපත් කරන ලද සිංහබාහු නාට්‍යය දර්ශනයක දීය.
- මොහු විසින් one act play නමින් හඳුන් හඳුන්වන ලද විනාඩි 40ක රංගනයක යෙදෙන නාට්‍යයක් නිෂ්පාදනය කළ අතර එය එවකට පවත්වන ලද නාට්‍ය උළෙලකදී හොඳම නාට්‍ය බවට පත් විය. එම නාට්‍ය **' මමත් මිනිහෙක්'** ලෙස නම් කරන ලද අතර මීට අමතරව **'ඉඳහිට යන ගමන්'** යන නාට්‍ය ද නිෂ්පාදනය කරන ලදී. මේ නිසාම මාක් ඇන්ටනි ප්‍රනාන්දු ලාංකික ප්‍රේක්ෂකයාට අමතක නොවන චරිතයක් බවට පත්විය.

## <u>නිශ්ශංක දිද්දෙණිය</u>



අඩ සිය වසක් පුරා එක ම වේදිකාවක රැඳී සිටි සුවිශේෂී කලාකරුවෙකු ලෙස නිශ්ශංක දිද්දෙණිය නම් කල හැක. සරච්චන්ද්‍රයන්ගේ **'සිංහබාහු'** වේදිකා නාට්‍යයේ **'සිංහබාහු'** ලෙස පුරා **විසි හය වසරක්** කරළිය මත විස්කම් පෑ ඔහු මෙරට ශෛලිගත නාට්‍යය සම්ප්‍රදායේ උරුමය මතු පරපුර අතරට ගෙන යන ප්‍රමුඛතම කලාකරුවෙක් ලෙස නම් කළ හැකි **වේ.දශක තුනකට ආසන්න කාලයක් ඔහු සිංහබාහු රඟපෑම වාර්තාගත සිද්ධියකි.**

- ගායනයට මෙන්ම උඩරට නර්තනයට ද එකසේ දක්ෂ වූ මොහු ප්‍රථම වරට සරච්චන්ද්‍රයන් තෝරා ගනු ලබන්නේ **'පේමතෝ ජායතී සෝකෝ'** වේදිකා නාට්‍යයට. එම නට්‍යයේ **පිංගල** ගේ චරිතය මඟින් ඔහු ගේ ගායන කුසලතාවය සාර්ථකව නිරූපණය කරන ලදි.
- අනතුරුව 1970 පසු සිංහබාහු නව නිෂ්පාදනය සඳහා සරච්චන්ද්‍රයන් විසින් මොහු තෝරා ගන්නා ලදී.
- දෙවැනි සිංහබාහු ලෙස **1970 ජූනි** වල සිට **1996 දක්වා** එක දිගට වසර **විසි හයක්** පමණ ඔහු විසින් සිංහබාහු චරිතය රඟපෑ අතර දර්ශන වාර පන් දහසකට වැඩි ප්‍රමාණයක් නිරූපණය කර ඇත.
- පසු කලෙක **'මනමේ කුමාරයා'** ලෙස **මනමේ** නාට්‍යයේ රඟපෑ අතර, **'ලෝමහංස'** නාට්‍යයේ **බ්‍රහ්මදත්ත රජුගේ චරිතය ද** , වෙස්සන්තර ගීත නාටකයේ සක්දෙව් චරිතය ද ඔහු රඟපෑවේ ය.
- එසේම **දයානන්ද ගුණවර්ධන** ගේ **'ගජමන් පුවත'** නාට්‍යයේ **ඇලපාත මුදලි** ගේ චරිතය ඔහු විසින් නිරූපණය කරන ලද අමතක නොවන චරිතයකි.





## <u>සාලමන් ෆොන්සේකා</u>



**සාලමන්** ෆොන්සේකා නාට්‍ය හා රංග කලාව ආචාර්ය උපාධියක් හිමි පළමු ශ්‍රී ලාංකිකයා ය.මොහු අභිරූපණ රංගනයෙහි අතිදක්ෂ වූ ශිල්පියෙක් විය.

**දයානන්ද ගුණවර්ධන ගේ** නාට්‍ය බොහෝ නාට්‍ය ගණනකට රංගනයෙන් දායක වී ඇති සාලමන් ෆොන්සේකා **නරිබෑනා** දෙවැනි නිශ්පාදනයේ දී නරියාගේ චරිතය නිරූපණය කරමින් ප්‍රේක්ෂක ආකර්ෂණය දිනා ගත්තේ ය. එසේ ම **ජීවන වංචාව හෙවත් ඉබිකට්ට** නාට්‍යයේ ඔහු **සාරගර්භ** ගේ චරිතය නිරූපණය කරන ලද අතර **ජස ලෙන්චිනා නාට්‍යයේ (1965) හෙන්වා** ගේ චරිතය ද රඟපා තිබේ.

රංග භූමි අලංකරණය හා වෙස් ගැන්වීම් පිළිබඳ ව ද ඔහු දක්ෂතා පෙන්වා ඇත. එසේම **සක්විති නික්මන** හා **අභිමි ජීවිත** යන නාට්‍ය නිර්මාණය කිරීම ද මොහු අතින් සිදුවී ඇත. එසේම **සුද්දිලාගේ කතාව, සිරිමැදුර** වැනි චිත්‍රපටවල රංගනයෙන් දායක වී ඇත. මිට අමතරව ටෙලි නාට්‍ය හා රූප රූපවාහිනී වැඩ වැඩසටහන් අධ්‍යක්ෂණය මොහු විසින් සිදුකර ඇත.



## <u>ත්‍රිලීෂියා ගුණවර්ධන</u> ( ත්‍රිලීෂියා අබේකෝන්)



ත්‍රිලීෂියා පළමු වැනි මනමේ කුමරිය විදිහට සිංහල නාට්‍ය ඉතිහාසයේ වාර්තාවක් තබපු කාන්තාවක්. ත්‍රිලීෂියා නම් රංගන ශිල්පිනිය ප්‍රථම වරට බිහිවන්නේ ළමා ගායිකාවක් ලෙස ය. මීට වසර අසූවකට පෙර දී **"සුරතල් නංගියෙ අපෙ අම්මා...."** යන ළමා ගීතය ගායනා කරමින් ජනප්‍රියත්වයට පත්වන මෙම ළමා රංගන ශිල්පිනිය අධ්‍යාපනයෙන් අනතුරුවව උසස්සස් අධ්‍යාපනය සඳහා පේරාදෙණිය ලංකා විශ්වවිද්‍යාලයට ඇතුළත් විය. ත්‍රිලීෂියාගේ ජීවිතයේ තවත් වෙනත් පරිච්ඡේදයක ආරම්භය මෙහිදී සටහන් විය. එනම් සරච්චන්ද්‍රයන්ගේ මනමේ නාට්‍ය මනමේ කුමරියගේ චරිත්‍ය සඳහා ඇයව තෝරා ගැනීමත් සමගය.

- **1960 දී වේදිකාගත වූ එදිරිවීර සරච්චන්ද්‍රයන්ගේ 'හස්තිකාන්ත මන්තරේ'** නම් නාට්‍ය යේ **වාසුලදත්ත** ගේ චරිතය රඟපාමින් සිය රංගන කුසලතාවය තවදුරටත් පෙන්නුම් කළා ය.
- මෙම නාට්‍ය නාට්‍යවලට අමතරවව **දයානන්ද ගුණවර්ධනගේ** ජනප්‍රිය නාට්‍ය නිර්මාණයක් වන **'නරිබෑනා'** නාට්‍යයේ මෙන්ම මහගමසේකරගේ **'කුණ්ඩලකේශී'** යන නාට්‍යයන්හි චරිත නිරූපණය කරන ලදී.
- වේදිකාව තුළ පමණක් නොව ඇය ටෙලි නාට්‍යය වලට සහ සිනමාව තුළ ද රංගනයෙන් දායක වී ඇත.
- ඒ අතර **ලෙස්ටර් ජේම්ස් පීරිස්ගේ ගම්පෙරළිය** චිත්‍රපටයේ **අනුලාගේ** චරිතය නිරූපණය කරන ලදී.
- 1984 දී හොඳම සහාය නිළිය ලෙස ඇයි සරසවි සම්මානයත්, ජනාධිපති සම්මානයත් ආදී ලෙස සම්මාන රැසක් දිනා ගත් දක්ෂ නිළියක් ලෙස නම් කළ හැක.
- පේරාදෙණියේ ලංකා විශ්ව විද්‍යාලයෙන් ශාස්ත්‍රවේදී උපාධිය ලත් ඇය කෝට්ටේ ආනන්ද ශාස්ත්‍රාලයේ ගුරුවරියක ලෙස කටයුතු කළේය.





## <u>සෝමලතා සුබසිංහ</u>



**ඇය** දක්ෂ නිළියක වගේම දක්ෂ අධ්‍යක්ෂවරියක ලෙස ද නම් කළ හැක. 1961 වර්ෂයේදී පේරාදෙණිය විශ්ව විද්‍යාලයට ඇතුළත් වූ ඇය එදිරිවීර සරච්චන්ද්‍රයන්ගේ **'රත්තරන්'** නාට්‍යයේ **මැහැල්ලගේ** චරිතය ද, **'එලොව ගිහින් මෙලොව ආවා'** නාට්‍යයේ **කළුහාමි** ලෙසද රංගනයෙන් දායක වෙමින් ඇය වේදිකාව මත පළමු පියවර තැබුවාය.

- අනතුරුව ගුණසේන ගලප්පත්ති ගේ **'මූදු පුත්තු'** නාට්‍යයේ සාරාගේ චරිතය නිරූපණය කරමින් ඇය දැක්වූ රංගන කුසලතාවය අතිශයින් විශේෂ වන අතර එය ප්‍රේක්ෂකයාගේ සිත තුළ නොමැකෙන සටහනක් වූ බව කිව හැකි ය.
- 1983දී පේරාදෙණිය සරසවියෙන් නාට්‍ය හා රංග කලාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් ලබාගෙන පිටවිය.
- රංගන ශිල්පිනියක වශයෙන් පමණක් නොව ඇය දක්ෂ නාට්‍ය නිෂ්පාදකවරියක ලෙස ද නාට්‍ය ක්ෂේත්‍රයේ නොමැකෙන නමක් තබා ඇත.

- **බර්ටෝල්ට් බ්‍රෙෂ්ට්** ගේ  නාට්‍ය නිර්මාණයක් වන **මවකගේ සංග්‍රාමය (Mother courage and her children)** නම් නාට්‍යයේ පරිවර්තනයක් වන **දිරිය මව සහ ඇගේ දරුවෝ** නම් නාට්‍ය ඇය විසින් නිෂ්පාදනය කරන ලද නාට්‍ය  කි.
- ඇය සෞන්දර්ය ගුරුවරියක වශයෙන් සේවය කළ අතර පසු පසුකාලීනව සෞන්දර්ය කලා විෂය මාලාව සංවර්ධනය කිරීම වැනි කටයුතුවල ද නිරත විය.
- ළමා හා යොවුන් නාට්‍ය  කෙරෙහි විශේෂ අවධානයක් යොමු කළ ඇය 1979දී  **'පුංචි අපිට දැන් තේරෙයි'** සහ **' තොප්පි වෙළෙන්දා'**  යන නාට්‍ය නිෂ්පාදනය කරන ලදී.
- තවද 80 දශකයේ මුල් භාගයේ දී ප්‍රථම වරට සම්මත අධ්‍යාපන රටාව ප්‍රශ්න කරමින් **'විකෘති'** නාට්‍යය නිර්මාණය කිරීමත් සමඟ ඇය සියලු දෙනාගේ විශේෂ අවධානයට ලක්විය.
- මෙම නාට්‍ය මගින් විවෘත ආර්ථිකය සමඟ ඇති වූ සමාජ සංකීර්ණත්වය වේදිකාවට ගෙන ඒමට ඇය සමත්ව විය.
- 'විකෘති'  නාට්‍ය කෙතරම් සාර්ථක ද කියතොත් අවුරුදු තිස් හතරක් පුරාවට අදටත් එම නාට්‍ය ලංකාවේ වේදිකාගත කෙරේ.
- එසේම ලංකාවේ ළමා සහ යොවුන් රංග ශිල්පීන් වෙනුවෙන් ඇය ආරම්භ කළ **' ළමා හා යොවුන් රංග පීඨය'** ඇගේ ශ්‍රම දායකත්වයෙන් නිර්මාණය කර ඇත.





- සෝමලතා සුබසිංහ විසින් නිමැවුණු නිර්මාණ රැසක් අප අතර ඇත ඒ අතරින්,
    - විකෘති
    - පුංචි අපට දැන්තේරෙයි
    - තොප්පි වෙළෙන්දා
    - හිමි කුමරිය
    - රත්මලී
    - ගමරාළ දිව්‍ය ලෝකෙට
- යන නිර්මාණයන් ඇයි විසින් රචනාකර නිෂ්පාදනය කරන ලද විශිෂ්ට නිර්මාණයන්ය.
- එසේම ඇය කලාශූරී, කලාකීර්ති වැනි සම්මාන වලින් ද පිදුම් ලබන ලද අතිවිශිෂ්ඨ රංගන ශිල්පිනක ලෙසට අදටත් අප අතර කතා බහට ලක් වී ඇත.



# <u>සිරිල් වික්‍රමගේ</u>



**සි**නමාවේ ටෙලි නාට්‍ය ක්ෂේත්‍රයේ මෙන් ම වේදිකාවේ ද එක සේ දස්කම් පෑ සිරිලිරිල් වික්‍රමගේ විසින් රඟ රඟපාන ලද විශිෂ්ටත ම චරිත්යක් ලෙස ගුණසේන ගලප්පත්තිගේ **'මූදු පුත්තු'** නාට්‍යයෙහි **'තේගිරිස්'** යන චරිතය හඳුන්වා දිය හැක. දරුවකු නොලබන ඔහු සරා විසින් ලබා ගන්නා ලද දරුවා ද ඝාතනය කිරීමට පෙලඹෙන්නේ මිනිස් සිතෙහි ඇති සංකීර්ණ භාවය ප්‍රකට කරවමිනි.

- ඉන්පසු ඔහු වේදිකාවෙ දි රඟපෑ නාට්‍ය අතර පහත නාට්‍යන් කැපීපෙනෙන නාට්‍ය වේ.
    - **කුවේණි**
    - **දේවතා එළි**
    - **එලොව ගිහින් මෙලොව ආවා**
    - **තවත් උදෑසනක්**
    - **පබාවතී**
    - **කදාවළලු**
    - **අහසින් වැටුන මිනිසුන්**
    - **ලියතඹරා**
    - **වෙස් මුහුණු**
    - **නැට්ටුක්කාරි**
    - **ඉඩම**
- සාර්ථක නළුවෙකු ලෙස ඔහු වේදිකාවේ මෙන්ම සිනමාව තුළත් ටෙලි නාට්‍ය කලාව තුළත් ජනප්‍රියතාවක් දිනාගෙන තිබේ.
- සත් සමුදුර නැමැති චිත් චිත්‍රපටයේ ඉතාමත් දක්ෂ රංගනයක යෙදුණු මොහු **'වෙස්ගත්තෝ', 'වල්මත් වූවෝ', 'බඹරු ඇවිත්', 'සෙලිනාගේ වලව්ව',** ආදී වශයෙන් චිත්‍රපට රැසක දක්ෂ චරිත නිරූපණයක යෙදී ඇත.
- ගුරුවරයෙකු වශයෙන් වෘත්තීමය සුදුසුකම් ලද ඔහු කොළඹ වෙස්ලි විද්‍යාලයේ ගුරුවරයකු ලෙස සේවය කළේ ය .

ඇගයීම:

මෙම පාඩමෙන් ඔබ ඉගෙනගත් එක් එක් නාට්‍යකරුවා දායක වූ නාට්‍ය ගොනුවන් සකසන්න.

# විවිධ ආගමික තේමා සොයා ගනිමු.

- නාට්‍යක තේමාවක් යනු කුමක්ද?
  නාට්‍යක තේමාව පිළිබඳව ඉහත පාඩම් වලදී විස්තර කර ඇති අතර නාට්‍යක තේමාව යනු නාට්‍යය මඟින් ප්‍රධාන වශයෙන් සමාජයට දෙනු ලබන පණිවිඩය ලෙස සඳහන් කළ හැක.එනම් එය සරල වශයෙන් කතාවේ මූලික බීජමය අවස්ථාව ලෙස නම් කළ හැක. එ අනුව තේමාවක් ඕනෑම කතාවක අන්තර්ගත වී ඇති මූලික හරය ලෙස ද සඳහන් කළ හැකි වේ. මේ සඳහා සරල නිදසුන් කිහිපයක් ලෙස,
  - සෙල්ලං ලෙල්ලං නාට්‍ය - තේමාව වන්නේ යහලුවන්ට උදව් කරමු.
  - පුංචි අපිට දැන් තේරෙයි නාට්‍ය- කම්මැලි වුනොත් හැමදාම ඒ පුද්ගලයා පරදින බවයි.
  - අමර ගියා දිව්‍යලෝකේ නාට්‍ය - තැනට සුදුසු නුවණ භාවිතය, උපක්‍රමශීලී බව

ආදී වශයෙන් නාට්‍ය තුළ අන්තරගත නාට්‍ය තේමා එකක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් තිබිය හැකි වේ.

- නාට්‍යක තේමාවක් තෝරාගැනීමේදී අපට විවිධ මූලාශ්‍රයන් මඟින් එය සොයා ගත හැකි වේ. එනම් ,
  - බෞද්ධාගම ආගමික කතා පුවත්
  - කිතුණු ආගමික කතා පුවත්
  - හින්දු ආගමික කතා පුවත්
  - ඉස්ලාම් ආගමික කතා පුවත්

  මෙම කතා පුවත් මඟින් ආගමික තේමාවන් මතුකර ගත හැකි අතර සමාජයට කිසියම් වූ ආදර්ශයක් ද ලබාදිය හැකි වේ.
- එහිදී අපට විශේෂයෙන්ම බෞද්ධ ආගමික කතා පුවත් **'පන්සිය පනස් ජාතක පොත'** ආශ්‍රයෙන් ලබා ගත හැකි අතර කිතුණු ආගමික කතා පුවත් **'ශුද්ධ වූ බයිබලයෙන්'** අපට ලබාගත හැක.එසේම හින්දු ආගමික කතා පුවත් **රාමායනය, ශිව පුරාණය** සහ ඉස්ලාම් ආගමික කතා පුවත් **අල්කුරාණය** ආශ්‍රයෙන් ලබා ගත හැක.
- අපි හැමෝම දන්න කාරණාවක් තමයි මෙමආගමික කතා පුවත් තුළ අන්තර්ගත තේමාවන් සමාජයේට යහපත් ආදර්ශයන් රැසක් ලබාදෙන බව. එනම් ,
  - වෙස්සන්තර ජාතකය- තමන්ගේ අරමුණ කවර බාධකය ආවත් ජය ගැනීම.
    - මෙහි වෙස්සන්තර රජතුමාගේ යහපත් පාලනය, කරුණාව වැනි චරිත ලක්ෂණ දක්නට ලැබේ.
    - මෙම චරිත ස්වභාවයන් වත්මන් සමාජයේ ජිවත් වන මිනිසුනට බොහොමයක් ආදර්ශ ලබා දීඇත.
  - වට්ටක ජාතකය- එකමුතුකමින් සමගියෙන් වැඩ කිරීමෙන් සියලු බාධක ජය ගත හැකි බව.
  - අපණ්ණක ජාතකය- නායකත්වයේ වටිනා වටිනාකම .
    - නිවැරදි නායකත්වය නිසා හැම විටම අනෙකාට යහපතක් සිදු වේ.
    - නායකත්වය දුබල වීමෙන් තමා පමණක් නොව අනෙකාද අමාරුවේ වැටෙන බව මේ ජාතක කතාවෙන් වැඩි දුරටත් අනාවරණය කරයි.

- උම්මග්ග ජාතකය- ප්‍රඥාවන්තකමේ වටිනාකම.






- නාස්තිකාර පුත්‍රයාගේ කතාව - හැමවිටම සැලකුම් ලැබිය යුත්තේ පාපී පුත්‍රයාය, මන්ද ඔඅහු යහපතට පුරුදු විය යුතු බැවිනි.
    - මෙම කතාවේ පියාගේ චරිතය ඉතාමත් ඉවසීමෙන් කටයුතු කරන, එසේම බුද්ධිමත්ව තීරණ ගන්න පුද්ගලයෙක් බව පසක් වේ.
    - දුරදිග නොබලා කටයුතු කිරීම, නාස්තිකාර ලෙස ජීවිතය ගත කරන ලද පුතාගේ චරිතය ඉක්මනින්ම විපාකය කරා යයි. එම ආදර්ශය අද ජීවත් වන අපට හොඳ පණිවිඩයක් ලබා දෙයි.
- යහපත් සමාරිතයාගේ කතාව - ජාතිය කුමක් වුවත් තමන්ට යහපතක් කරන්නා තමයි යහපත් ජාතිකයා වන්නේ.




- විෂ්ණු දෙවිදුන් නරගාසුරන් නමැති අසුරයා පරාජය කිරීමේ කතා පුවත - ජීවිතයේ යහපත පලවා හැර යහපත ලගා කර ගැනීම. මනා වූ ඉවසීම.




- ඒ අනුව මෙවැනි කතා තේමාවන් නාට්‍ය නිර්මාණය සඳහා භාවිතා කිරීම මගින් යහපත් පණිවිඩයක් සමාජයට ලබා දීමට හැකි වේ.
- එසේම මෙම ආගමික කතා පුවත් තුල අන්තර්ගත චරිත මඟින් ද අපේ ජීවිතයට ආදර්ශයන් ලගා කර ගත හැකි වේ.

- එම ආගමික තේමාවන් මතු කර ගැනීම සඳහා යොදාගත හැකි එක් ජාතක කතාවක් ලෙස අප නළපාන ජාතකය ගනිමු.
    - ❖ එකෝමත් එක රටක තිබුණා පොකුණක්. ඒ පොකුණට රාක්ෂකයෙක් අරක්ගෙන හිටියා. ඒ හින්දා ඒපොකුණේ දිය බොන්න කිසිම සතෙක් සිව්පාවෙකුට ඉඩක් ලැබුණෙ නැහැ. එක්තරා වඳුරු කණ්ඩායමක නායක වඳුරා මේ ගැන හොඳින් නිරීක්ෂණය කරා. සත්තු පොකුණට ගියපු අඩිපාරවල් නම් තියනවා. නමුත් නැවත පොකුණෙන් ගොඩට ආපු අඩි සළකුණු නම් නැහැ. වඳුරු නායකයා තේරුම්ගත්තා මේ පොකුණෙ යම් අනතුරක් තියනවා කියලා. වඳුරු නායකයා තමන්ගේ කණ්ඩායමත් එක්ක කැලේට ගිහින් බට පඳුරකින් බට කඩාගෙන ඇවිත්, පොකුණ ආසන්නයේ තිබුණු ගස් උඩට නැගල පොකුණට බටේ දාලා වතුර බිව්වා. වඳුරු නායකයාගේ ස්ථානෝචිත ප්‍රඥාව නිසා වඳුරු කණ්ඩායම රාක්ෂයාගෙන් බේරුණා.



- මේ සාරාංශ ගත කළේ නළපාන ජාතකය කියල අපි හැමෝම දන්නවා. ඉතින් නළපාන ජාතකය තුල අන්තර් ගත වන ප්‍රධාන තේමාව ලෙස ‘ස්ථානෝචිත ප්‍රඥාව’ හැඳින්විය හැක.

- මෙහිදී ප්‍රධාන චරිත ලෙස අපට මෙම චරිත ගත හැකි අතර වඳුරු රංචුව සඳහා නිර්මාණශීලීව චරිත කීපයක් භාවිතා කළ හැක.
    - නායක වඳුරා
    - උදක නම් වූ රාක්සයා
    - වඳුරු රංචුව

වඳුරු රංචුව →
- නිතර කලබල වන වඳුරෙක්
- අනුවණ ගති ඇති වඳුරෙක්
- දඟකාර ගති ඇති වඳුරෙක්

- මේ අයුරින් විවිධ ආකාරයේ චරිත නිර්මාණය මඟින් අපට නාට්‍ය නාට්‍යෝචිතව, තේමාවට අනුකූලව නිර්මාණය කර ගත හැකි වේ.

## සැලකිය යුතුයි

❖ ක්‍රියාකාරකම් සඳහා යොදාගත හැකි කතා පුවත් දෙකක් පහත දැක්වේ.

### <u>යහපත් සමාරිතායාගේ කතාව</u>

අසල්වැසියා යනු කවරේ ද ? යන ප්‍රශ්නය අයෙකු ජේසුතුමාගේන් ඇසූ අවස්ථාවේ දී එතුමා විසින් පවසන ලද උපමා කතාවකි. එය හඳුන්වනුයේ යහපත් සමාරිතයා ගේ උපමා කතාව නමින් ය.

එක් වංශවත් මිනිසෙක් ජෙරුසලමෙන් පිටත්වී මහ මඟ යද්දී සොර මුළකට හසු විය. සොරු ඔහු සතු දෙය පැහැර ගෙන ඔහුට තළා පෙළා අඩපණ කොට මහ මඟ දමා ගියහ. මහ මඟ යන වංශවත් යුදෙවු පූජකයෙක් ද වංශවත් යුදෙව් නීතිඥයෙක් ද මොහු දැක ඔහු දෙස නොබලාම පාරේ අනිත් පැත්තෙන් ගියහ.

මේ අතර එතැනින් ගමන් ගත් යුදෙව් වර්ගයා සතුරකු ලෙස සලකන සමාරිතානු වර්ගයට අයත් මිනිසෙක් ඔහුගේ තුවාල වලට තෙල් හා මිදියුෂ ගල්වා ප්‍රතිකාර කොට තානායමට ගෙන ගියේ ය. පසුව තානායම්කරු ට මුදල් ගෙවා ඔහුට අවශ්‍ය පහසුකම් හා ප්‍රතිකාර ද ලබා දීමට කටයුතු කළේය. මෙම සොරුන් අතට පත්වූ පීඩා විඳි පුද්ගලයාට සැබෑ අසල්වැසියා වූයේ ඔහු විසින් සතුරකු ලෙස සලකන ලද ඔහුට උදව් උපකාර කළ පුද්ගලයා ය.

### <u>නාස්තිකාර පුත්‍රයා ගේ කතාව</u>

එක් පියකුට පුත්‍රයෝ දෙදෙනෙක් වූහ. ඔවුන්ගේ බාලයා පියාට කතා කොට තමාට අයත් දේපල පංගුව ලබා දෙන ලෙස ඉල්ලුවේ ය. පියා දෙදෙනාට ම අයත් කොටස් බෙදා දුන්නේ ය. ටික දිනකට පසු බාල පුත්‍රයා තම දේපළ විකුණා මුදල් රැගෙන දුර රටකට ගොස් ඒවා නාස්තිකාර ලෙස වියදම්කර දුරාචාරයේ යෙදී අසරණ තත්ත්වයට පත්විය. අවසානයේ දී ඔහු ඌරු කොටුවක දාසයකු බවට පත්විය. ඌරන්ට දෙන කෑම ඔහුගේ ද භෝජනය බවට පත් විය. මෙලෙස අන්ත අසරණ ව සිටින ඔහුට පියා ගේ කරුණා දයානුකම්පාව මතක් වන්නට විය.

පියා ගේ මෙහෙකරුවන් පවා තමාට වඩා සුව පහසු ලෙස ජීවත් වන අයුරු සිහියට නැඟෙන්නට විය. බාල පුතා නැවත පියා වෙත හැරී අවුත් මා හට පුත්‍රයකු ලෙස නොව දාසයකු ලෙස සමාව දෙන්නැයි අයැද සිටියේ ය. තමා දෙවියන් වහන්සේට හා පියාට එරෙහි ව ගතකළ ජීවිතය ගැන පසුතැවිලි විය. පියා තම පුතුට මෙහෙකරුවන් කැඳවා සළුව ගෙන බාල පුතුට පළඳවන ලෙසත් ඇඟිල්ලෙහි මුදුවක් ද , පයට පාවහන් ද පළඳවන ලෙසත්, ඔහු වෙනුවෙන් විශේෂ භෝජන සංග්‍රහයක් පිළියෙල කරන ලෙසත් දන්වා සිටියේ ය.

මේ අතර ඔහුගේ වැඩිමහල් පුත්‍රයා ගොවිපළ සිට එන විට නිවසෙහි සිට නැගෙන නැටුම්, ගැයුම්, වැයුම් හඬ අසා මවිත විය.' ඔබේ නැති වූ සහෝදරයා පැමිණ සිටී. ඔබේ පියා එය ජයෝත්සවයෙන් සමරනවා' යැයි දාසයෝ පැවසූහ. වැඩිමල් සහෝදරයා කිපී පියා අමතා තමා බොහෝ කාලයක් පියාට කීකරු ව නිවසේ වැඩ සිටියේ ය. එවිට පියාගේ පිළිතුර වූයේ 'අප ප්‍රීති සන්තෝෂ විය යුතු ම ය. මේ ඔබේ මල්ලි මැරී සිටි නමුත් නැවත ජීවත්ව සිටී' යන්න යි.

**ඇගයීම:**

1. ඔබ කැමතියි බොදු කතා හෝ කිතුණු කතා දෙකක් තෝරා ගෙන එහිකතා වස්තුව ලිඛිතව චිත්‍ර භාවිතා කරමින් නිර්මාණාත්මකව ලියා දක්වන්න.
2. ආගමික නාට්‍ය සඳහා යොදාග ගත හැකි කතා පුවත් මාලාවක් සකස් කරන්න

# බොදු කිතුනු කථා පුවත් රංගනයට

- කතාවක් නාට්‍ය පෙළක් බවට පත් කිරීමේදී පහත දැක්වෙන කරුණු පිළිබඳව අවධානය යොමු කළ යුතු ය.
    - පිටපත ලිවීමට පෙර රචකයා සතු පරිකල්පනය මෙහෙයවා කටයුතු කිරීම අවශ්‍ය වේ.

- **<u>නාට්‍යෝචිත අවස්ථා පෙළ ගස්වා ගැනීම.</u>**
    - කතා වස්තුවේ අන්තර්ගත නාට්‍යෝචිත අවස්ථා පෙළ ගස්වා ගැනීම මුලින්ම සිදුකළ යුතුවේ.
    - කුඩා සිද්ධි රසක් එකට එක්ව වී අවස්ථාවක් නිර්මාණය වන අතර එම අවස්ථාවන් නාට්‍යයට උචිත පරිදි තර්කානුකූලව සකස් කර ගැනීම මෙහිදී සිදු කළ යුතුවේ.
    - එහිදී විශේෂයෙන්ම නාට්‍යෝචිත අවස්ථාවන් තෝරා ගැනීමේදී විශේෂයෙන් නාට්‍ය සඳහා අත්‍යාවශ්‍යය අවස්ථා පමණක් තෝරා ගැනීම සිදු කළ යුතු වේ.
    - අනතුරුව එසේ තෝරා ගත් අවස්ථා මුල් මැද අග ලෙස පිළිවෙළින් පෙළගස්වා ගැනිම වැදගත් ය.
    - මෙම තෝරා ගන්නා ලද නාට්‍යෝචිත අවස්ථා ප්‍රේක්ෂක විශ්වාසය ඇති වන අයුරින් තෝරා ගත යුතු ය.

- **<u>සංවාද නිර්මාණය කිරීම.</u>**
    - ඒ ඒ නාට්‍යෝචිත අවස්ථාවන්ට උචිත පරිදි සංවාද නිර්මාණය කිරීම අනතුරුව සිදු කළ යුතු වේ.
    - සංවාද මගින් නාට්‍යට නව අර්ථකතනයක් එක්වන නිසාවෙන් සංවාද නිර්මාණය පිළිබඳව විශේෂ අවධානයක් යොමු කිරීම් වැදගත් වේ.
    - එම් සංවාද නිර්මාණයේ දී නාට්‍යයේ තේමාව උද්දීපනය වන අයුරින් උචිත සංවාද නිර්මාණය කිරීම අවශ්‍ය වේ.
    - සංවාද නිර්මාණයේ දී විශේෂයෙන් චරිතයේ අනන්‍යතාවයට අනුකූලව සංවාද නිර්මාණය කිරීම වැදගත් වේ.එනම් නිදසුනක් ලෙස,

      *හාමුදුරුනමක්, හොරෙක්, වෙළෙන්දෙක්, දේශපාලකයෙක්, ගුරුවරයෙක්, රජ කෙනෙක්, සිඟන්නෙක්, මහලු පුද්ගලයෙක්, ආදී චරිත භාවිතා කරන භාෂා ඒ ඒ පුද්ගලයා අනුව වෙනස් වේ.
    - එම වෙනස අපට නාට්‍ය තුළ නිර්මාණයේදී විශේෂ අවධානය යොමු කළ යුතු වේ.මන්ද එම චරිතය භාවිතා කරන සංවාද එම චරිතයේ අභ්‍යන්තර මෙන්ම බාහිර ස්වරූපයට හේතු වන නිසාවෙනි.
    - සංවාද භාවිතයේදී විශේෂයෙන්ම අප අවධානය යොමු කල යුතු තවත් කරුණක් ලෙස, භාවිතා කරන ශෛලිය පිළිබඳව විශේෂ අවධානයක් යොමු කළ යුතු වේ. එනම් 'නාට්‍ය ධර්මී' හෝ 'ලෝක ධර්මී' යන්න තෝරා ගත යුතුවේ.ලෝක ධර්මී ශෛලිය තෝරා ගත් විට දී අපට එදිනෙදා පරිසරයේ භාවිතා කරන සංවාද රටාව යොදාගත හැකි අතර, නාට්‍යය ධර්මි ශෛලිය තෝරා ගැනීමේදී ඒ සඳහා කවි ගීත ආදිය ඇතුළත් කරමින් නිර්මාණය කළ හැක.
    - සංවාද නිර්මාණය කිරීමේදී අප තෝරාගත් කතා පුවත අයත් කාල වකවානු පිළිබඳව ද අවධානය යොමු කළ යුතු වේ. නිදසුනක් වශයෙන්, රජකාලයේ සිදු වූ කතා පුවතක් නම් එහිදී භාවිතා කරන සංවාද රටාව වෙනස් වේ. ඊට අනුකූලව සංවාද නිර්මාණය කිරීම සිදු කළ යුතු වේ.
    - එසේම පරිසර තත්වය ගැන අවධානය යොමු කිරීමේදී ගැමි පරිසරය සහිත තේමාවක් නම් එහිදී සංවාද එකී පරිසර තත්වයට උචිත පරිදි නිර්මාණයය කිරීම වැදගත් වේ.

❖ <u>ගැටුම නිර්මාණය කිරීම.</u>

- අනතුරුව එම චරිත හා සංවාද නාට්‍යෝචිත ව ගැටුම් සහිතව උපක්‍රමශීලීව, තාර්කිකව නිර්මාණය කිරීම කළ යුතුය.
- නාට්‍යයේ ගැටුම නාට්‍යක් සඳහා අත්‍යවශ්‍යාවශ්‍ය අංගයකි මෙහිදී ගැටුමක් යනු ප්‍රතිවාදී මතයන් දෙකක් එකට ගැටීමයි. කතාව තුළ අන්තර්ගත වී ඇති ගැටුම් අවස්ථා පමණක් මෙහිදී තෝරා ගත් යුතුවේ. එම අවස්ථා උචිත ලෙස නාට්‍යයේ තේමාවට හානියක් නොවන පරිදි නිර්මාණයය කළ යුතු වේ.
- එසේ නිර්මාණය කිරීමේ දී ඔබ තෝරාගන්නා කතාව නව මගකට හෝ නව අර්ථකථනයකට අනුව නිර්මාණය කිරීමේ අයිතිය ඔබ සතු වේ.

❖ <u>චරිත නිර්මාණය.</u>

- එහිදී ඉහත සඳහන් කළ පරිදි චරිත නිර්මාණය ඉතාම නිර්මාණශීලීව මෙන්ම නාට්‍යෝචිතව නිර්මාණයකි කිරීමේ අයිතිය ඇත.
- නාට්‍ය සඳහා අනවශ්‍ය වන වැඩි චරිත භාවිතා කිරීම මගින් නාට්‍යයේ තේමාවට හානියක් සිදු විය හැක.
- මෙසේ චරිත නිර්මාණය මගින් නාට්‍යට වැඩි නාට්‍යෝචිත බවක් එකතු කිරීමට හැකි වේ. නමුත් එය කථා වස්තුවේ තේමාවට බාධාවක් නොවිය යුතු වේ.

වඳුරු රංචුව
→ නිතර කලබල වන වඳුරෙක්
→ අනුවණ ගති ඇති වඳුරෙක්
→ දඟකාර ගති ඇති වඳුරෙක්

- එසේ නිර්මාණය කරන්නට යෙදුණු කතා පුවතෙහි අන්තර්ගත චරිත සඳහා නිර්මාණශීලීව වේශභූෂණ නිර්මාණය කළ හැකි වේ.
- නාට්‍ය සඳහා අවශ්‍ය පරිදි නළු නිලියන් තෝරා පත්කරගෙන මෙම නාට්‍ය ප්‍රේක්ෂක පිරිසක් ඉදිරියේ රංගගත කළ හැක.
- එම රංගගත කිරිමට පෙර ප්‍රේක්ෂක ආකර්ශනය ලබා ගැනීම සඳහා පහත සඳහන් පරිදි පෝස්ටර් එකක් නිර්මාණය කර ප්‍රදර්ශනය කළ හැකි වේ. ඒ සඳහා පවත්වන වෙලාව, ස්ථානය, නාට්‍යයේ නම, ඉදිපත් කරන පිරිස ( විද්‍යාලිය නාට්‍ය සංගමය ), ප්‍රවේශ පත්‍ර, යන කරුණු අන්තර්ගත කිරීම අනිවාර්ය වේ.
- එසේම මේ සඳහා ඔබගේ නිර්මාණශීලි හැකියාව භාවිතා කිරීම වැදගත් වේ. එනම් ඔබට පහසුවෙන් සපයා ගත හැකි අමුද්‍රව්‍ය භාවිතා කරමින්, චිත්‍ර මගින් වර්ණවත් කර ගනිමින් නිර්මාණය කළ යුතුය.

## සැලකිය යුතුයි

➢ පහත දැක්වෙන වේදිකා නාට්‍ය පෝස්ටර් පරිඝනක තාක්ෂණය භාවිතා කරමින් නිර්මාණය කර ඇති අතර ඔබගේ නාට්‍ය පෝස්ටරය සඳහා එවැනි ක්‍රමවේදයන් භාවිතා නොකරන්න.







**ඇගයීම**

1. ඔබ කැමති බොදු කතාවක් හෝ කිතුනු කතාවක් තෝරාගෙන එහි නාට්‍යමය අවස්ථා පෙළගස්වා ඊට අදාළ චරිත සංවාද ගැටුම් අවස්ථා යොදාගනිමින් නාට්‍ය පෙළක් රචනා කරන්න. එහිදී ඒ ඒ චරිත සඳහා වඩාත් සුදුසු වේශභූෂණ ඇඳ පාට පැන්සල් මාධ්‍යයෙන් වර්ණ ගන්වන්න.

2. එම නාට්‍යය නිර්මාණය සඳහා සුදුසු නිර්මාණශීලී පෝස්ටරයක් නිර්මාණය කරන්න.

# <u>කදා වළලු නාට්‍යයේ තේමාව හා කතා වස්තුව</u>

## ❖ කදා වළලු නාට්‍යට පසුබිම් වූ කතා වස්තුව. (සේරිවාණිජ ජාතකය)



- බුදුරජාණන් වහන්සේ සැවැත්නුවර ජේතවනාරාමයේ වැඩවසන සමයේ පසුබට වූ වීර්යය ඇති භික්ෂුවක් උදෙසා සේරිවාණිජ ජාතකය දේශනා කොට ඇත .

  එක්තරා භවයක සේරිව රාජ්‍යයෙහි වෙළෙඳ කුලයක උපන් බෝසතුන් කච්ඡපුට යැයි නම් ඇතිව සේරිවාණිජ නම් වෙළඳ එක්ක අන්ධපුරයේ දෙමගකින් ගොස් බඩු විකුණ අතරතුර සේරිවාණිජ එක් දුප්පත් සිටුදියණිය කෙනෙකුට කදාවලලු විකිණීමට ගත් උත්සාහයේදී දුප්පත්කම නිසා මුදල් නැති බැවින් තම පරපුරේ පළමු මහ සිටාණෝ දන් වළදා ඉවත් කොට මලගැසී ගිය රන් තලිය දී වළලු ගැනීමට තැත් කළ අවස්ථාවේ එය ගනරන් බව දැක නො වටිනා බව කියමින් ඉවතට වීසි කොට උපායකින් එය හැරගනිමියි සිතා ඉවත්ව ගිය අතරේ එම සිටු මාළිගයට පැමිණ බෝසත් කච්ඡපුට වෙළෙන්දා එම රන් තලියට තමා සතු සියලු කහවණු හා භාණ්ඩ ද දී එය රැගෙන ගියේය .

  නැවත ආපසු පැමිණි සේරි වෙළෙන්දා සිදු වූ දේ දැන ඔරුවෙන් ගඟෙන් එගොඩ වෙමින් සිටි කච්ඡපුට වෙළෙන්දාට සාප කරමින් ළය පැළී ද්වේශ සහගතව මිය ගියේය . එතැන් පටන් සසරේ විවිධ භව වලදී රැගෙන ආ වෛරය සිද්ධාර්ථ ගෞතම බුදුන් සමය තෙක් රැගෙන ආ අයුරු ජාතක කතාව සංක්ෂිප්තව දක්වයි.



## ❖ කදා වළලු නාට්‍යයේ කතා වස්තුව



- වළලු වෙළෙන්දන් වූ සේරිවානිජ හා කච්ජපුට වෙළදාමේ යති. ඔවුන් නීලවාහිනි ගඟෙන් එතෙර වී අන්ධපුරයට ඇතුල් වෙති. සේරිවාණිජ කපටි, මසුරෙක් වූ අතර කච්ජපුට සාධාරණ අවංක අයෙක් විය. මොවුන් දෙදෙන මෙහි වෙළදාමේ යෙදෙන විට සේරිවාණිජට සිටු නිවසක සිටි මිත්තනියක හා සිටු දියණියක හමු වන අතර එහි සිටු දූවට වළලු ගැනීමට ආශා ඇති කරවයි. එහෙත් ඔවුන් දැන් දුගී බැවින් මුදල් නොමැති බව මිත්තණිය පවසයි. අනතුරුව සිටු දියණිය නිවසේ තිබූ පැරණි තලියක් වෙළෙන්දාට දී වළලු ඉල්ලයි.එය දඹ රන් බව දැනගත් වෙළෙන්දා එය නොවටින බව පවසා බැනවදිමින් යන්නේ, පසුව ඇවිත් කපටිකමින් එය ලබාගැනීමේ අරමුණෙනි.

  පසුව කච්ජපුට ද එම නිවසටම පැමිනේ. ඔවුහු වැඩි වර්ණනා නොකරන අතර ඔහුගේ මිල ගණන් ඉහළ ද නො වේ. සිටු දියණිය පෙර සේම අර දඹ රන් වටින තලිය ගෙනැවිත් දුනි. එවිට ඔහු එම රන් තලිය බලා පවසන්නේ මෙය කහවණු ලක්ෂයක්වත් වටින බවත්, තමා ළඟ එතරම් මුදල් නැති බවත් ය.කෙසේ හෝ වළලු පෙට්ටියත් තම කහවණු දහසකුත් ලබා දෙන කච්ජපුට පසුව පැමිණ තව කහවණු දහසක් ලබා දීමට පොරොන්දු වී පිටවෙයි.මෙය නොදැන ආපසු පැමිණි සේරිවාණිජ සිද්ධිය දැනගෙන කච්ජපුට ඇල්ලීමට දිව යයි.

- මෙකි කථා වස්තුව නිරූපණය කිරීමේදී ගීත ගායනා, සංගීතය, අලංකාර සංවාදයන් ආදිය එක් කර ඇත.



❖ <u>ජාතක කථා වස්තුව තුල අන්තර්ගත ප්‍රධාන තේමාවන්.</u>

- **එක් සමයෙක තිලෝගුරු බුදු රජානන් වහනසේ සැවැත් නුවර වැඩ සිටි සමයේ ජේතවනාරාමයෙහි වැඩ වසන සේක. පසුබට වීර්ය ඇති භික්ෂූන් වහන්සේ කෙනෙක් අරඹයා මේ ජාතකය වදාල සේක.**
- ගුණධර්ම රැකගෙන අවංකව කටයුතු කිරීම නිසා යහපතක් උදාකර ගැනීමේ හැකියාව ඇති බව.
- ගුණධර්ම නොමැතිව ආත්ම ලාභය පමණක් මුල් කොටගෙන ගෙන වැඩ කටයුතු කිරීමෙන් තමන් නොදැනුවත්ව ම ජීවිතෙන් පරාද වෙන බව.
- යමක් අහිමි වීම නිසා ඇතිවන දැඩි කම්පාව තමන්ගේ විනාශයට හේතු වන බව ද අනාවරණය කර ඇත.

❖ <u>නාට්‍යයේ කතා වස්තුව තුළ අන්තර්ගත ප්‍රධාන තේමාවන්.</u>

- සියල්ලන් නොපසුබට වීර්යයෙන් කටයුතු කළ යුතු වීම.
- අප්‍රමාදව කටයුතු කිරීමෙන් ජීවිතයේ අභියෝග ජය ගත හැකිය.
- වඩාත් අවංක ව කටයුතු කිරීමෙන් විවිධ ප්‍රතිලාභ අත්වන බව.
- ධනය හා බලය අහිමි වූ විට සිටුවරුනට පවා අනුනට අත පා අතපා ජීවත් ජීවත් වීමට සිදු වේ.
- අධික තෘෂ්ණාව විනාශයට හේතු වේ.
- අනුන් රැවටීමට උත්සාහ ගැනීමෙන් තමා ද රැවටීමට ලක් වේ.
- තැනට සුදුසු නුවණින් ක්‍රියා නොකළ විට පසුතැවීමට සිදු වේ.
- වෛරයෙන් වෛරය නොසන්සිදෙයි.
- ප්‍රඥාවන්තයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කිරීමෙන් ජීවිතයට සැප ළඟා කර ගත හැකි වේ.
- උක්ත තේමා රැසක් සේරිවාණිජ ජාතකයෙන් හෙළි වුවද ඉන් එක් ප්‍රබල තේමාවක් ඉස්මතු වේ.එනම්,
    - **අධික තෘෂ්ණාවෙන් කටයුතු කිරීමත්,ස්ථානෝචිත ප්‍රඥාව නොමැති වීමත් පුද්ගල විනාශයට හේතුවක් වේ.**

❖ <u>**කදාවළලු නාට්‍ය සඳහා පසුබිම් වූ ජාතක කතා වස්තුවේත්, නාට්‍යයේ දැක්වෙන කථා වස්තුවෙත් සමාන – අසමානතා.**</u>

ජාතක කථාව තුළ අන්තර්ගත සියලුම සිද්ධි හා අවස්ථාවන් නාට්‍යය සඳහා අන්තර් අන්තර්ගත කළ නොහැක. මන්ද නාට්‍යයක සිද්ධි හා අවස්ථා ගොඩ ගොඩනැගීමේ දී ඉහත පාඩම් වල සඳහන් පරිදි නාට්‍ය සඳහා උචිත වන අවස්ථා පමණක් තෝරා ගත යුතු වේ. ඒ අනුව ජාතක කථාව තුළ සහ කදා වළලු නාට්‍යයේ අන්තර්ගත අවස්ථා හා සිද්ධි මෙසේ සඳහන් කළ හැක. ඇතැම් අවස්ථාවල එහි සමාන මෙන්ම අසමාන ලක්ෂණණ අපට දැකගත හැකි වේ.

- ජාතක කථා වස්තුව මුල සිට අවසානය දක්වා මුල, මැද, අග සහිත ව සිදුවීම් පෙළක් සේ රචනා වී ඇති අතර ම එම සියලු සියුම් සිදුවීම් නාට්‍ය පෙළ සඳහා ඇතුළත් කර නොමැත.

- නාට්‍ය සඳහා ජාතක කථා වස්තුවෙන් ප්‍රබල නාට්‍යෝචිත අවස්ථා පමණක් තෝරාගෙන ඉදිරිපත් කර ඇත.
- ජාතක කතාවේ පූර්ව කතා මාලාව මේ නාට්‍ය සඳහා භාවිතා කර නොමැති අතර ජාතක කතාවේ අවසානයේ සේරිවාණිජ පපුව පැලී මිය යන බව සඳහන්ව ඇතත්, නාට්‍යයේ එම සිද්ධිය අන්තර්ගත කර නොමැත. නාට්‍යයේ දී සේරිවාණිජ ගඟ අසබඩට ගොස් තොටියා හට නැවත ගොඩට පැමිණෙන මෙන් කෑ ගසමින් හඬා වැලපෙයි.
- ජාතක කතාවේ මෙන්ම නාට්‍යයේ කථා වස්තුව මගින් බෝසත් චරිතයේ උත්තම ගුණාංගයන් ප්‍රබල ලෙස මතු කොට දැක්වීමට උත්සාහ කර ඇත. එනම් කච්ඡපුට වෙළෙන්දාගේ මානව හිතවාදී ගුණාංගයන් මෙන්ම, අවංක භාවය වැනි චරිත ලක්ෂණ මතු කර ඇත.
- එනම් සේරිවාණිජ වෙළෙන්දා රන්තලිය වංචාවෙන් ලබා ගැනීමට උත්සාහ දැරීමේදී උත්තම වූ බෝධිසත්ව ගුණාංගයන් ගෙන් පරිපූර්ණ කච්ඡපුට වෙළෙන්දා දුප්පත් සිටුදියණියටත් සිටු පවුලේ මිත්තණිය ටත් සාධාරණය ඉටු කරන අයුරු දැකිය හැක.
- ජාතක කථාව තුළ අන්තර්ගත සේරිවාණිජ ගේ අධම ස්වරූපය එකී ලක්ෂණ සහිතව වංක බව, මුසාවාදය, දැඩි මසුරුකම් ආදී දුර්ගුණ වඩාත් ඉස්මතු වන පරිදි නාට්‍ය තුළ සේරිවාණිජ චරිතය නිර්මාණය කර ඇත.
- ජාතක කථාතාවේ ප්‍රධාන චරිත හතරක් ඇති අතර නාට්‍ය සඳහා චරිත පහක් මගින් කතා වස්තුව ඉදිරිපත් කරයි. මෙහිදී විශේෂයෙන් අතීත වක්තෘ කෙනෙක් භාවිතා කරමින් ජාතක කථාව තුළ අන්තර්ගත එහෙත් නාට්‍යයේ ඉදිරිපත් කළ නොහැකි ඇතැම් සිදුවීම් එම චරිතය මඟින් අනාවරණය කරයි.
- නාට්‍යකරුවා මෙහි දී සමාජයේ පැවැත්ම උදෙසා වටිනා තේමාවක් ඉස්මතු වන අයුරින් ගද්‍ය, පද්‍ය සාහිත්‍ය, ගීත ආදිය මෙන්ම අලංකාර රංග වස්ත්‍රාභරණ රංග භාණ්ඩ ආදී අනුශාංගික කලා එක් කරමින් දෘශ්‍ය කාව්‍ය (නාට්‍ය) මාධ්‍ය කොට ගනිමින් මෙම නාට්‍ය ප්‍රේක්ෂකයා ඉදිරියට ගෙන එනු ලබයි.



**ඇගයීම:**

1. සේරිවාණිජ ජාතක කතාවේ ඇතුළත් එහෙත් කදා වළලු නාට්‍යයේ ඇතුළත් නොවන අවස්ථා හා සිද්ධි වෙන වෙනම පෙළගස්වන්න.

# කදා වළලු පෙළ නාට්‍ය රස විදීම.

## ❖ කදා වළලු නාට්‍ය හා පසුබිම් වූ තොරතුරු අධ්‍යනය කිරීම.

- 1958.09.06 දින බොරැල්ලේ තරුණ බෞද්ධ සමිති ශාලාවේ දී මුල්වරට කදා වළලු නාට්‍ය රඟ දක්වන ලදි.
- නාට්‍ය සඳහා මූලික වශයෙන් පාදකව ඇත්තේ සේරිවාණිජ ජාතක කතාව යි.
- ජාතක කථාවේ සඳහන් කතා පුවත එලෙසින් ම මුල, මැද, අග, සහිත ව කදාවළලු නමින් නාට්‍යයක් ලෙස රචනා වී ඇත.
- ජාතක කතාවට අදාළ පුවත සියුම් ලෙස අර්ථ විවරණය කිරීම නාට්‍යයෙන් සිදුව ඇත.
- බෝධිසත්වයන්ගේ චරිත නාමයෙන් ජාතක කථාව නම් කිරීම බොහෝ විට සිදු වුව ද මෙම ජාතක කතාව නම් කර ඇත්තේ දුෂ්ට ගති ඇති සේරි නම් වෙළෙන්දාගේ නාමයෙනි.
- කදා වළලු නාට්‍යයේ හි සේරිවාණිජ වෙළෙන්දා ගේ චරිතය වඩා ඉස්මතු කර ඇත.
- කදා වළලු නිශ්පාදනයේ දී සේරි ගේ චරිතය සඳහා දීප්තිමත් ඇඳුම් යොදාගෙන ඇති අතර ඔහුගේ ගායනය පවා ඉතා කන්කලු නාද රටා වලින් යුක්ත ව ඇත.
- නාට්‍යයේ ප්‍රධාන චරිතය හිමිවන්නේ කච්ඡපුට නම් වූ බෝසත් චරිතයටයි. කච්ඡපුට යනු කිහිල්ලේ පසුම්බිය ගසාගෙන යන අරුතින් යොදාගත් පටබැඳි නාමය කි.
- දුෂ්ට පැවතුම් ඇති පුද්ගලයකු ගේ චරිතය හා ක්‍රියා ඉස්මතු කිරීමෙන් එවන් චර්යා ප්‍රතික්ෂේප කර මිනිසුන් යහමගට යොමු කිරීම නාට්‍යකරුගේ පරමාර්ථය වන්නට ඇත.



## ❖ කදා වළලු නාට්‍යයේ සාර්ථකත්වය උදෙසා සංවාද ශෛලිය චරිත හා ගැටුම් අවස්ථා භාවිතා කර ඇති ආකාරයය අධ්‍යයනය කිරීම.

නාට්‍යයක් නිර්මාණය කිරීමේ දී පළමු වශයෙන් එයට උචිත වන කතා වස්තුවක් තෝරාගන්නා අතර ඉන් නාට්‍ය සඳහා උචිත අවස්ථා හා සිද්ධි පෙළගස්වමින් මුල, මැද, අග සහිත ව නාට්‍යයේ පෙළ රචනා කරනු ලබයි. සංවාද, චරිත අන්තර්ගතව රචනා කරන ලද මෙම පෙළ ප්‍රේක්ෂකයා ඉදිරියට ගෙන යනු ලබන ප්‍රමුක වාහකයා වන්නේ නළු නිළියන් ය. මේ අයුරින් නිර්මාණය වන නාට්‍යයේ අනෙකුත් සියළුම ආනුෂංගික අංග ශෛලියකට අනුකූලව පෙළගැස්වීම සිදුවේ.

ඒ අනුව මෙම කදා වළලු නාට්‍ය නාට්‍ය ධර්මී යන ශෛලියකට අනුගතව නිර්මාණය වී ඇති අතර එහි ආනුෂංගික කලාවන්ගේ භාවිතයේ සාර්ථකත්වය විමසා බලමු

- ශෛලිය

සෑම නාට්‍යයක් තුළම අන්තර්ගත නාට්‍ය ශෛලියක් දක්නට ලැබේ. එවැනි ප්‍රධාන නාට්‍ය ශෛලීන් දෙකක් අපට හමුවේ. එනම්,

**ශෛලිය**

**නාට්‍ය ධර්මී ශෛලිය**

ලොව පවතින සැබෑ ස්වභාවයට වඩා වැඩි යමක් එක් කරමින් (අතිශයෝක්තින්) වෙනස් අයුරකින් සතර අභිනය භාවිතා කිරීම මෙහිදී සිදුවේ.

**අන්තර් ගත සුවිශේෂ ලක්ෂණ**

- සංවාද භාවිතයේ දී ලිඛිත බස්වහරක් භාවිතා කරන අතර එය ලාලිත්‍යමය ස්වරූපයක් ගැනීමකවි ගායනා හා ගීත . .ගායනා බහුලව දක්නට ලැබීම
- ලාලිත්‍යයෙන් යුතු අංග වින්‍යාසයන් දක්නට ලැබෙන අතර වඩාත් එසැවුණු පියවර තබමින් නර්තනයේ යෙදෙමින් ගමන් කිරීම මෙහි දක්නට ලැබෙන විශේෂ ලක්ෂණයකි.
- අනාගත හෝ අතීත වක්තෘ යන චරිතය මගින් හා පසුබිම් ගායක පිරිස් විසින් නිරූපණය නොවන අවස්ථා අනාවරණය කිරීම.
- පසුතල භාවිතයක් දක්නට නොලැබෙන අතර ගීත ගායනා මගින් පසුබිම් විස්තර කිරීම.
- වේදිකාවේ තාලානුකූල ව වටයක් යාමෙන් ස්ථාන මාරු වීම් සිදු කිරීම.
- අංග රචනය හා රංග වස්ත්‍රාභරණ භාවිතයේ දී ඉතාමත් විචිත්‍රවත් අයුරින් නිර්මාණය කිරීම.

**ලෝක ධර්මී ශෛලිය**

ලෝකයේ පවතින යථා ස්වභාවයට අනුව ම සතර අභිනය භාවිතා කිරීම මෙම නාට්‍යවල දී සිදුවේ.

**අන්තර් ගත සුවිශේෂ ලක්ෂණ**

- එදිනෙදා ජීවිතයේ දී භාවිතා කරන භාෂා ස්වරූපය සංවාද සඳහා භාවිතා කිරීම.
- රංග වස්ත්‍රාභරණ සහ අංග රචනය කිරීමේ දී පවතින ස්වභාවයට අනුකූලව කිසිදු වෙනසක් සිදු නොවන පරිදි නිර්මාණය කිරීම.
- නාට්‍යයේ අන්තර්ගත පසුතලය නාට්‍යයට උචිත පරිදි නිර්මාණය කිරීම මෙහි ඇති විශේෂ ලක්ෂණයක් ලෙස පෙන්වාදිය හැක.
- නාට්‍ය සඳහා අවශ්‍ය වන වේදිකා ආලෝකය නිර්මාණාත්මකව අවස්තාවනට උචිත පරිදි භාවිතා කිරීම.
- අවශ්‍ය වන රංග භාණ්ඩයන් ස්වභාවිකව ම නිර්මාණය කර භාවිතා කිරීම.
- මෙහි දී නාට්‍යයේ අර්ථය වඩාත් තීව්‍ර කර ගැනීම සඳහා ලෝක ධර්මී නාට්‍ය ස්වභාවික ලක්ෂණ සහිත ව ගීත නිර්මාණය කිරීම් දක්නට ලැබේ .

❖ <u>නාට්‍ය ධර්මී හා ලෝක ධර්මී නාට්‍ය සඳහා නිදසුන් ලෙස පහත සඳහන් නාට්‍ය නිර්මාණ දැක්විය හැකි වේ.</u>

- නාට්‍ය ධර්මී ශෛලියට අයත් නාට්‍ය සඳහා ප්‍රබල නිදසුනක් වශයෙන් එදිරිවීර සරච්චන්ද්‍රයන් ගේ **මනමේ** හා **සිංහබාහු** යන නාට්‍ය පෙන්වා දිය හැක.

**මනමේ නාට්‍ය**




**සිංහබාහු නාට්‍ය**




- ලෝක ධර්මී නාට්‍ය සඳහා නිදසුන් වශයෙන් ආර්. ආර්. සමරකෝන් මහතාගේ **කැලණි පාලම** නාට්‍යය සෝමලතා සුභසිංහ මහත්මියගේ **විකෘති** නාට්‍යයත් පෙන්වා දිය හැක.

**විකෘති නාට්‍යය**




කැලණි පාලම නාට්‍ය





මෙම ලෝක ධර්මී හා නාට්‍ය ධර්මී යන ශෛලීන් වල අන්තර්ගත ලක්ෂණ සංයෝජනය වීමෙන් මිශ්‍ර ශෛලිය නිර්මාණය වේ මෙම මිශ්‍ර ශෛලියට අදාළ ව නාට්‍ය නිර්මාණ අපට ද දැක ගත හැක. ඊට නිදසුනක් වශයෙන් දයානන්ද ගුණවර්ධනයන්ගේ **නරි බෑණා** නාට්‍ය පෙන්වා දිය හැක.

**නරි බෑනා නාට්‍ය**





මෙම කදා වළලු නාට්‍ය තුළදී ද මෙම ශෛලීන් ද්විත්වයටම අයිති ලක්ෂණ දක්නට ලැබේ. නමුත් කදා වළලු නාට්‍යයේ බහුලව නාට්‍ය ධර්මී ලක්ෂණ දක්නට ඇති නිසා මෙම **නාට්‍ය නාට්‍යධර්මී ශෛලිය** ට අයත් නාට්‍යයක් ලෙස සලකනු ලබයි.

නාට්‍යක ශෛලිය පිළිබඳව අවබෝධය ලබා ගැනීම සඳහා විශේෂයෙන්ම නාට්‍ය පෙළ අධ්‍යයනයේ දී හා නාට්‍ය නැරඹීමේ දී එම නාට්‍ය සඳහා භාවිත කොට ඇති සංවාද, අංග රචනය, වේශභූෂණ, පසුතල නිර්මාණය ආදී සියලු අභිනයන් පිළිබඳ අධ්‍යයනය කිරීම අනිවාර්යය වේ.ඒ අනුව කදා වළලු නාට්‍යයේ අන්තර්ගත ශෛලිය පිළිබඳ අවධානය යොමු කිරීමේ දී අපට මෙම අංගයන් පිළිබඳව වෙන් වෙන් වශයෙන් අධ්‍යයනය කළ යුතු වේ.

- සංවාද භාවිතය.
- රංග භූමිය අලංකරණය.
- අංග රචනය.
- වේශභූෂණය.
- චරිත.
- අවස්ථා සම්බන්ධය.

## ➢ සංවාද භාවිතය

සේරිවාණිජ ජාතක කතාව කියවීම් මගින් එය කියවන පාඨකයාගේ මනස තුළ සංකල්ප රූප මැවේ . එයට ප්‍රබල හේතුව වන්නේ භාෂාව භාවිතය යි. එසේම මෙම කදා වළලු නාට්‍යයේ නාට්‍ය පෙළ කියැවීමේදී ද අපට එවැනි අවස්ථා බොහොමයක් දක්නට ලැබේ. නාට්‍යයක් නැරඹීමට නොහැකි අවස්ථාවක දී අපට එම නාට්‍යයේ රසය විඳීමට හැකියාව ලැබෙන්නේ එහි පෙළ සඳහා භාෂාව භාවිතා කර ඇති ආකාරය අනුව ය.

ඕනෑ ම සාහිත්‍ය නිර්මාණයක් සාර්ථක වීම සඳහා එයට යොදා ගන්නා භාෂාව ප්‍රබල දායකත්වයක් ලබාදෙන අතර භාෂාව මඟින් පාඨක හා ප්‍රේක්ෂක සිත් තුළ ප්‍රබල සංකල්පය රූප මැවිය හැකි වේ. ඒ අනුව කදා වළලු නාට්‍ය පෙළ කියවීමේ දීත්, නාට්‍ය සජීවීව රස විඳීමේ දීත් ,එබඳු අවස්ථා දැකිය හැක. නිදසුනක් වශයෙන්,

- කච්චපුට ගඟින් එතෙර වීමේදී ප්‍රේක්ෂක මනස තුළ ගඟක් නිර්මාණය වීම .
- නාට්‍ය ආරම්භයේ සේරිවාණිජ වෙළෙන්දා ගයන සින්දුව

**"අතට වළලුද පයට ගිගිරි ද ලා ගනී**

**කිඳුරගන සොබනා**

**වනේ සිඳඹුවො කඩා මල් පෙති**

**වරල සරසා ගනිති නිතිනා**

**සඳුන් කුංකුම ගතේ තවරා සුවඳ වේ අබිසාරිකගනා**

**පියවි සුන්දර රූ සපුව වුව ලකළ වේ ලූ සඳ පඳලනා....."**

මෙම ගීතය ගයන විට සුන්දර ළඳකගේ රූ සපුව ප්‍රේක්ෂක මනසේ චිත්‍රණය කරවීම මෙම ගීතයේ යොදාගත් වචන මගින්, එනම් භාෂාව මගින් ගම්‍ය මාන කරවීමට රචකයා සමත් වී ඇත.

- නව යොවුන් වියේ පසුවන දැරියක් සුන්දර ඇඳුම් ආයිත්තම් පැළඳීමට දක්වන රුචිය ,නාට්‍ය කරුවා යොදාගත් සංවාද මගින් මැනවින් ප්‍රකට කරයි .

  **සිටු දූව :- මගේ අත්දෙකේ පාළුවට මොනවහරි දාගත්තොත් හොදයි අත්තම්මේ.මට මේ රතු වළලු කුට්ටම ඇත්නම් කියලා හිතෙනවා.**

චරිත ස්වභාවයන් හි අන්තර්ගත ගුණාංග ඉස්මතු කිරීම සඳහා නාට්‍යකරුවා විසින් ඒ ඒ චරිත සඳහා උචිත වන භාෂාවක් හසුරුවා ඇත. නිදසුන් වශයෙන් කච්චපුට සහ සේරිවාණිජ යන වෙළෙඳුන් දෙදෙනා සඳහා භාවිතා කර ඇති සංවාද මගින් මෙය අවබෝධ වේ.

- **සේරිවාණිජ :- "කෝ බලන්න පොඩ්ඩක් (තලිය දෙස හොඳින් බලා ඒ රත්තරන් බව දැන මදක් සිනා සී නැවත දේවිය දෙස බලා) අපෝ....... දැලිත් ගැවුණා. එහෙම පිටින්ම කළු ගැහිලා (තලියට අත ගසා) අනික, පුපුරලා නේ මැද්දෙන් ම."**

- **සේරිවාණිජ :- "කවුරු කෑවත් මටනං වැඩක් නෑ සිටු දේවිය. (තලියට ගසා නාද කොට) කවුද මේක රත්තරන් කිව්වේ . මේක මහ බාල ලෝහ වර්ගයක් නෙ."**

දියණියනුත්, මිත්තණියනුත් සේරිවාණිජ වෙළඳුන්ට මෙන්ම කච්චපුට වෙළෙඳුට ද රන්තලිය පෙන්නවූ අවස්ථාව,

- **කච්ඡපුට: "මං කියන්නද ඇත්ත ? මේ තලිය මම ගෙනයන එක යුතු නෑ.මේක සිටු ගෙයටම අයිති පුරාණ බඩුවක්.මෙහේම තියෙන්න අරින එක තමයි හොඳ."**

  **මිත්තණිය : (සිනාසී) පොඩි ළමයින්ට තේරෙන්නේ නෑනේ. හුගක් වටිනව කියලයි එයාගෙ කල්පනාව**
  **කච්ඡපුට : මම කියපු එක තේරිලා නෑ මගේ හිතේ. මේක හබෑම වටිනා තලියක්. මේ කළු ගැහිලා තිබුණාට කළවම් නොකරපු හොඳ ම රත්තරං මේකට ගෙවන්න මා ගාව සල්ලි නැති නිසයි ගෙනියන එක යුතු නෑ කිව්වේ.**

නාට්‍යයේ එන පරිදි එක හා සමාන චරිත දෙකක් එහෙත් ප්‍රතිවිරුද්ධ චරිත ලක්ෂණ පෙන්වන අයුරින් නිර්මාණය කිරීම සඳහා ඒ ඒ චරිතයට ගැළපෙන අයුරින් සංවාද යොදා නාට්‍ය රචනා කොට තිබීම නාට්‍යයේ නිර්මාණශීලී ගුණය ප්‍රකට කරන ලක්ෂණයකි.

මෙම නිදසුන් පිළිබඳව අවධානය යොමු කිරීමේ දී කදා වළලු නාට්‍යයේ වැඩි වශයෙන් ලෝක ධර්මී ශෛලිය ට අයත් සංවාද දක්නට ලැබේ. නමුත් ඇතැම් අවස්ථාවලදී ගීත ගායනාවන් ද අන්තර්ගත වී ඇති බව දක්නට ලැබේ. ඒ අනුව මෙම කදා වළලු නාට්‍යයේ සංවාද ශෛලීන් දෙකෙහි ලක්ෂණයන් වලට අනුව නිර්මාණය වී ඇති බව අවබෝධ වේ.

## ➢ <u>රංග භූමිය අලංකරණය.</u>

ඉහත දී සඳහන් කළ ආකාරයට නාට්‍ය ධර්මී ශෛලියෙන් නාටයා සඳහා පසුතල අලංකරණ කිසිවක් භාවිතා නොකරයි. එය ශෛලිගත හෙවත් නාට්‍ය ධර්මී නාට්‍යවල අන්තර්ගත විශේෂ ලක්ෂණයක් ලෙස පෙන්වා දිය හැක. ඒ අනුව අවශ්‍යය කරන පසු තලයන් විස්තර කිරීම් සඳහා ගීත ගායනා සහ අනාගත හෝ අතීත වක්තෘ මඟින් අනාවරණය කිරීමක් සිදුවේ. එක් ස්ථානයක සිට අනික් ස්ථානයට මාරු වන බව හැඟවීම සඳහා වේදිකාව මත වටයක් ගොස් පැමිණීම සිදු කරයි.

මෙම නාට්‍යයේ ප්‍රථම දර්ශනයේ දී එම වේදිකාව **ජපන් නෝ නාට්‍ය සම්ප්‍රදායට අයත් කබුකි රංග භූමියට** අයිති කොටසක් වන **හණමිචිය** නම් කොටස් භාවිතා කර ඇති අතර, සේරිවාණිජ රන්තලිය සොයමින් ගඟ දෙසට දිවීම නිරූපණය කළේ මෙම හණමිචිය නම් කොටස භාවිතා කරමිනි.



කබුකි වේදිකාවේ හණමිචිය

## ➢ <u>අංග රචනය.</u>

කදා වළලු නාට්‍යයේ අංග රචනය පිළිබඳ ව අවධානය යොමු කිරීමේ දී එය නාට්‍යධර්මී ශෛලියෙන් අනුකූලව භාවිතා කර ඇත. නාට්‍ය ධර්මී සම්ප්‍රදායේ දී අංග රචනය සඳහා විචිත්‍රවත් වර්ණ භාවිතා කිරීම සිදුවේ. එසේ භාවිතා කරන වර්ණ හැඩතල මඟින් චරිතයට කිසියම් වූ අර්ථකතනයක් ලබාදීමට සමත් වී ඇත.

- නිදසුනක් වශයෙන් ගත්හොත් එදිරිවීර සරච්චන්ද්‍රයන්ගේ මනමේ නාට්‍යයේ වැදි රජු සහ සිංහබාහු නාට්‍යයේ සිංහයා යන යන චරිත වෙන් වෙන් වශයෙන් ගත්හොත් එහි අංග රචනය

ඉතාම අලංකාර ලෙස සිදුකර ඇති  අතරම එමගින් චරිතයට ගාම්භීරත්වයක් එක් කිරීමට එම අංග රචනයට හැකිවී ඇත.




එසේම මෙම අංග රචනය තුළ අස්වාභාවික ස්වරූපයක් දක්නට ලැබේ. ඒ අයුරින්ම  කදා වළලු නාට්‍ය යේ අංග රචනය සිදුකර ඇත ආකාරය පහත සඳහන් ඡායාරූප මඟින් වඩාත් අවබෝධ වේ.




- <u>**රංග භාණ්ඩ**</u>

මෙම නාට්‍ය සඳහා රන්තලිය සහ වළලු කද පමණක් නාට්‍ය  උපකරණ සඳහා භාවිතා කර ඇත. නාට්‍ය ධර්මී ශෛලියට අයත් නාට්‍ය වල දී බහුලව රංග භාණ්ඩ භාවිතය දක්නට නොමැත එලෙසින් ම කදා වළලු නාට්‍ය තුළත් අත්‍යාවශ්‍යම නාට්‍ය උපකරණ දෙකක් පමණක් භාවිතා කර ඇත.



- <u>**වේශභූෂණය.**</u>

වේශභූෂණ හෙවත් රංග වස්ත්‍රාභරණ නිර්මාණයේ දී ප්‍රථම වශයෙන් රංග ශෛලිය පිළිබඳව විශේෂ අවධානයක් යොමු කළ යුතු වේ. මන්ද නාට්‍ය අයත් වන කාලයේ යුගය ආදියට විශේෂ අවධානයක් යොමු කරමින් රංග වස්ත්‍රාභරණ නිර්මාණයය කිරීම සිදුකරන බැවිණි.ජාතක කතාවක්  පදනම් කොටගත් නාට්‍යයක් වන බැවින් ඊට වඩාත් උචිත රංග වස්ත්‍ර භාවිතයක් මෙම කදා වළලු නාට්‍ය තුළ දක්නට ලැබේ.

එහිදී එම යුගයට ගැළපෙන ආකාරයෙන් කාල්පනික ව සිතා මෙම වේශ වේෂභූෂණ නිර්මාණය කර ඇත.

  

තවද එක් විශේෂ කාරණාවක් නම් මෙම නාට්‍යයේ සේරිවාණිජ යන චරිතය සඳහා වඩාත් දීප්තිමත් ඇඳුමක් නිර්මාණයය කර තිබීමයි. ඒ ඒ චරිතයන්ගේ බාහිර සමාරෝපය වඩාත් ඉස්මතු වන පරිදි රංග වස්ත්‍රාභරණ සහ රංග ආභරණ නිර්මාණය සිදුකර ඇත.

- **චරිත.**
  - **අතීත හා අනාගත වක්තෘ යන චරිතය.**

කදා වළලු නාට්‍ය ආරම්භ වන්නේ ද අවසන් වන්නේ ද ඔහුගේ ගායනයෙනි. ජාතක කතාවක කථා වස්තුවක් නාට්‍යට නැගීමේ දී එහි එන සියලු සිදුවීම් හා අවස්ථා ඇතුළත් කිරීමට නොහැකි බැවින් අතීත ජාතක කතාව අනාවරණය කිරීමත්, ජාතක කතාවේ පූර්ව හා අපර සන්ධි ගැලපීමටත් මෙම චරිතය ප්‍රබල දායකත්වයක් සපයනු ලැබේ. නාට්‍ය ධර්මී ශෛලිය තුළ දක්නට ලැබෙන සුවිශේෂී ලක්ෂණයක් ලෙස මෙම චරිතය පෙන්වා දිය හැක.

**අතීත වක්තෘගේ සිංදුව.** (නාට්‍ය ආරම්භයේ ගායනා කරයි)

**අතීතේ හි මෙම කප ට පෙර වූ**

**කපෙහි පස්වැනි - බෝසතාණෝ**

**කච්ඡපුට වාණිජය නම් යුත්**

**වලළලු වෙළෙන්දෙක් වී උපන්නෝ**

**සේරී නම් අන් වෙලද කෙනෙකුන්**

**සමග ගොස් වෙළදාම් කරන්නෝ**

**ගම් නියම් ගම් සැරි සරන්නෝ**

**නිලවාහිනී ගඟින් එතෙර ව**

**අන්ධ පුරයට සැපත් වන්නෝ**

**අන්ධ පුරයේ වීදී ඔස්සේ**

**විකුණ විකුණා වලළලු යන්නෝ //**

- **මිත්තණිය**

වර්තමාන සමාජයේ තුළ අප දකින වැඩි වැඩිහිටියෙකුගේ ලක්ෂණ ඇයගේ චරිතය තුළින්ද ද මනාව නිරූපණය කර ඇත නිදසුනක් වශයෙන් කොතරම් දිළිඳු වුව ද තම මිනිපිරියගේ ආශාව ඉටුකර කර දීමට මිත්තණිය ගන්නා වෙහෙස.

**මිත්තණිය:- අඬන්න එපා දූවේ.... ඔය තරම් හිතට ගන්න වගක් දන්නව නම් කොහොමහරි වළලු කුට්ටමක් අරන් දෙනවනේ. ඇයි මට කිවුවේනැත්තේ මීට ඉස්සර ? ඒ මිනිහ ගාව විතරයැ වළලු තියෙන්නේ? වෙන දවසක බැරියැ, සල්ලි ටිකක් කොහොමහරි හොයාගෙන.**

වළලු කසී රටෙන් ගෙනාපු බව පවසන විට මිත්තණිය විසින් පවසන සංවාද මගින් මිත්තණිය සමාජය පිළිබඳව වැඩි අවධානයකින් යුක්ත චරිතයක් ලෙස නිරූපණය කර ඇති.

**මිත්තණිය- කසීර රටෙන්? මොන පිස්සුද? කසී රටේ වළලු ගේනවා යැ ? අන්න, කසී රටේ සළු නම් හදනවා. බොරු කියන්නෙ මිනිස්සු රවට්ටන්න.**

වලළලු මිලදී ගත නොහැකි වූ විටදී තම මිනිපිරියගේ හිත සැනසීම, කරුණු කාරණා අවබෝධ කර දීම.

- **සිටු දූව**

ධනයෙන් පිරිහුණු කල්හි රජවරුන්ට සිටුව උන්ට පවා අන්‍යයන්ට අත පෑමට සිදුවේය යන ධර්මතාවය ප්‍රකට කරවමින් සිටු පවුලේ ඉතිරි වී ඇති සිටු දූව හා මිත්තණිය යන සාමාජිකයන් දෙදෙනාගේ චරිත නාට්‍යයේ විකාශනයට ප්‍රබල දායකත්වයක් දරන අයුරින් සමස්ත නාට්‍ය පුරාම විකාශනය කර තිබීම නාට්‍යයේ සාර්ථකත්වයට හේතු වී ඇත.

ඇතැම් අවස්ථාවල දී සිටු දියණිය විසින් ප්‍රකාශ කරන සංවාද මඟින් ඒ බව පැහැදිලි වේ.

**සිටු දූව :- "(දුක්මුසු ස්වරයකින්) අපි සිටු කුලේ ඇත්තෝ වුණාට දැන් නම් හොඳටම දුප්පත්. ගිය අවුරුද්දේ නීලවාහිනී ගඟ ගලලා තාත්තයි අම්මයි සහෝදරයෝ තුන්දෙනයි ඔක්කොම මළා. තාත්තා රැස් කරපු දනේත් එහෙම පිටින් ම නැති වුණා. මම අහල පහල ගෙවල්වල මෙහෙ කරලා හම්බ කරන එකකින් තමයි අපි දෙන්නා යන්තම් ජීවත් වෙලා ඉන්නේ".**

රූ සපුව අලංකාර කර ගැනීම කෙරේ අවධානය යොමු කරන නව යොවුන් වියට එළඹෙන දූවකගේ අපේක්ෂාවන් කදා වළලු නාට්‍යයේ නාට්‍ය වින්‍යාසයට මනා පිටිවහලක් වේ.



**සිටු දූව :- මගේ අත්දෙකේ පාළුවට මොනවහරි දාගත්තොත් හොඳයි අත්තම්මේ. මට මේ රතු වළලු කුට්ටම ඇත්නම් කියලා හිතෙනවා.**

සිටු දූව කෙසේ හෝ වළලු ලබා ගන්නට දරන උත්සාහය නිසා නාට්‍ය ඉදිරියට ගලායාමට සලස්වන නාට්‍යකරුවා එම චරිතය නාට්‍යයේ සාර්ථකත්වය කෙරෙහි ප්‍රබල දායකත්වයක් ලබාදෙන චරිතයක් ලෙස නිර්මාණය කර ඇත.

- නාට්‍යයේ ආරම්භයේ සිටු දූව සේරිවාණිජ වෙළඳුගේ ගීතයට සවන් දීම.
- ඉන් පසු ඔහුගෙන් වළලු ලබා ගැනීමට තැත් කිරීම.
- රන්තලිය ලබාදී හෝ වළලු ලබා ගැනීමට ගත් උත්සාහය ව්‍යර්ථ වීම.
- දෙවනුව පැමිණි කච්චපුට වෙළෙන්දාට රන් තලිය දී වළලු ලබාගැනීම.
- ඉන් ලැබූ වළලු අතේ දමා අහිංසක යුවතිය මෙන් සතුටු වීම.

ආදී වශයෙන් නාට්‍යයේ විකාශයට දායක වූ චරිත දෙකක් අතර ප්‍රබල ගැටුමක් ඇති වන අවස්ථාවේදී තම බලාපොරොත්තු සඵල වීමෙන් සිටු දූව හා මිත්තණිය චිත්ත සන්තුෂ්ටියට පත්ව ඔවුන්ට තිබුණු ප්‍රබල ගැටලුව නිරාකරණය වීම ආදී අවස්ථා සියල්ල ඉතා සාර්ථක ව නාට්‍ය කරුවා කදා වළලු නාට්‍ය මගින් පෙන්වා දෙයි. ඒ අවස්ථාවලට අදාල කර ගත් චරිත වඩාත් සාර්ථකව එම අවස්ථාවට ප්‍රේක්ෂකයා හමුවට ගෙන ඒම චරිත නිරූපණයේ විශිෂ්ට අවස්ථාවක් වේ.

- **කච්ඡපුට**

කිහිල්ලේ පසුම්බිය ගසාගෙන යන අරුත් ඇතිව පටබැඳී නාමයකි. නාට්‍යයේ ප්‍රධාන චරිතය වන මෙම චරිතය පරමාදර්ශී වෙළෙන්දෙකු ගේ චර්යා රටාවකින් යුත් සරල පුද්ගලයෙකි. ඉතාමත් අවංකව තම ජීවිකාව ගත කරන බව ඔහුගේ හැසිරීම් රටාව මඟින් පිළිබිඹු කරයි. කච්ඡපුට වෙළෙන්දා හා සිටු දියණියන් අතර කෙරෙන කතාබහ සඳහා නාට්‍යකරුවා යොදාගත් සංවාද. එම චරිතයේ, බෝසත් ගුණ ප්‍රකට කරන බව පහත සඳහන්සංවාදයෙන් අවබෝධ වේ.



**කච්ඡපුට:- "මං කියන්නද ඇත්ත ? මේ තලිය මම ගෙනයන එක යුතු නෑ.මේක සිටු ගෙයටම අයිති පුරාණ බඩුවක්.මෙහේම තියෙන්න අරින එක තමයි හොඳ."**

**මිත්තණිය :- (සිනාසී) පොඩි ළමයින්ට තේරෙන්නේ නැනේ. හුගක් වටිනව කියලයි එයාගෙ කල්පනාව**

**කච්ඡපුට :- මම කියපු එක තේරිලා නෑ මගේ හිතේ. මේක හබෑම වටිනා තලියක්. මේ කළු ගැහිලා තිබුණාට කළවම් නොකරපු හොඳ ම රත්තරං මේකට ගෙවන්න මා ගාව සල්ලි නැති නිසයි ගෙනියන එක යුතු නෑ කිව්වේ.**

මෙහිදී කච්ඡපුට විසින් අවංකව ඉහත නිහතමානීව අවස්ථාවට උචිත පරිදි කටයුතු කිරීම නිසා ඔහු හට ධනවතකු වීමට මඟ පෑදීම.(කඩයක් දමා ගැනීමට මග පෑදීම).

මෙම චරිත්‍යෙහි විශේෂත්වය නම් මෙම චරිතය ප්‍රධාන චරිතය වුවද කිසිදු විශේෂත්වයක් මෙම චරිතයට ලබා නොදීමයි. එනම් සරල ඇඳුම් පැළඳුම්, සරල කතාබහ සහිත සරල ජීවිතයක් ගත කරන සාමාන්‍ය පුද්ගලයෙක් ලෙස මෙම චරිතය නිර්මාණය කිරීම මඟින් අධ්‍යක්ෂවරයාගේ මූලික අරමුණ වී ඇත්තේ, **එසේ සරල ගති පැවතුම් ඇතිව ජීවත් වන පුද්ගලයන් හට වුවද ජීවිතයේ සාර්ථකවය කරා යා හැකි බව අනාවරණය කිරීමකි.**

- **සේරිවාණිජ**

දුෂ්ට ගති පැවතුම් ඇති පුද්ගලයෙක් වන අතර ඔහුගේ නමින් මෙම ජාතක කතාව නම් කර තිබීම තුළ විශේෂත්වයක් ඇත. එනම් වැඩි වටිනාකම් සහිත ව ජීවත්වන පුද්ගලයන් කවර සැප සම්පත තිබුණද ජීවිතයේ හොඳ ගති පැවතුම් නැති වූ කල්හි කවර පුද්ගලයෙක් වුවද විනාශයිට පත්වන බවයි.

දියණියනුත්, මිත්තණියනුත් සේරිවාණිජ වෙළඳුන්ට රන්තලිය පෙන්නවූ අවස්ථාවේ දී ඔහුගේ මුවට නවන දෙබස් මඟින් ඔහුගේ කපටිකම, මුලාව නිරූපණය කරයි.

**සේරිවාණිජ :- "කෝ බලන්න පොඞ්ඩක් (තලිය දෙස හොඳින් බලා ඒ රත්තරන් බව දැන මදක් සිනා සී නැවත දේවිය දෙස බලා) අපෝ....... දැලිත් ගෑවුණා. එහෙම පිටින්ම කළු ගැහිලා (තලියට අත ගසා) අනික, පුපුරලා නේ මැද්දෙන් ම."**

**සේරිවාණිජ :- "කවුරු කෑවත් මටනං වැඩක් නෑ සිටු දේවිය. (තලියට ගසා නාද කොට) කවුද මේක රත්තරන් කිව්වේ . මේක මහ බාල ලෝහ වර්ගයක් නෙ."**

එකී අරමුණ පෙර පෙරදැරි කොට කොටගෙන කදා වළලු නාට්‍ය තුළද ඔහුගේ චරිතය සඳහා වැඩි වටිනාකමක් දීමට නාට්‍යකරුවා සමත් වී ඇත. එහිදී ඉතා වටිනාකමින් යුත් දීප්තිමත් රංග වස්ත්‍රාභරණ

ඔහු සඳහා නිර්මාණය කර තිබීම හා ඉතාමත් කන්කලු නාදරටා වලින් යුක්ත ව ගායනය කිරීමේ හැකි හැකියාවත් ඔහුට ලබා දී තිබීම මඟින් ඔහුගේ චරිතය සඳහා වැඩි වටිනාකමක් එක්කර ඇත.

- නාට්‍ය ආරම්භයේ සේරිවාණිජ වෙළෙන්දා ගයන සින්දුව.

**"අතට වළලුද පයට ගිගිරි ද ලා ගනී**

**කිඳුරගන සොබනා**

**වනේ සිඳඹුවො කඩා මල් පෙති**

**වරල සරසා ගනිති නිතිනා**

**සඳුන් කුංකුම ගතේ තවරා සුවඳ වේ අබිසාරිකාගනා**

**පියවි සුන්දර රූ සපුව වුව ලකළ වේ ලූ සඳ පඳලනා....."**

එම චරිතයේ කුට වෙළෙන්දෙකුගේ ලක්ෂණ වන පෙළඹවීම,පරිභව කිරීම, තණ්හාව, වෛරය වැනි ලක්‍ෂණයන් ද ඉස්මතු කර දැක්වෙයි.

- සේරිවාණිජ වලළලු ගෙනැවිත් සිටු දුවට විකිණීමට සූදානම් වන අවස්ථාව.

**සේරිවාණිජ:- 'ගෙයි තියෙන වළලු නිතර පාවිච්චියට හොඳ නෑ. ඒව දැම්මාම පරිස්සම මදි'.**
**'මේ අන්ධපුරේ දැන් එන්න එන්නම හොරු වැඩි වෙනවා'.**

මෙකී සියලු වටිනාකම් වලින් පරිපූර්ණ වුවද කපටිකම්, මුලාව, වංකව කටයුතු කිරීම, තණ්හාව ආදී දුර්ගුණ යන්ගෙන් පිරුණු කල්හි ඔවුන් ඉක්මනින් විනාශය කරා යන බව මෙම චරිතය මගින් ඉතාමත් සාර්ථකව අනාවරණය කර ඇත.

නාට්‍යයේ එන පරිදි එක හා සමාන චරිත දෙකක් එහෙත් ප්‍රතිවිරුද්ධ චරිත ලක්ෂණ පෙන්වන අයුරින් නිර්මාණය කිරීම සඳහා ඒ ඒ චරිතයට ගැළපෙන අයුරින් සංවාද යොදා නාට්‍ය රචනා කොට තිබීම නාට්‍යයේ නිර්මාණශීලී ගුණය ප්‍රකට කරන ලක්ෂණයකි.නිදසුනක් වශයෙන්,

- දියණියනුත්, මිත්තණියනුත් සේරිවාණිජ වෙළඳුන්ට මෙන්ම කච්චපුට වෙළෙඳුට ද රන්තලිය පෙන්නවූ අවස්ථාව,

**සේරිවාණිජ**

**සේරිවාණිජ :- "කෝ බලන්න පොඩ්ඩක් (තලිය දෙස හොඳින් බලා ඒ රත්තරන් බව දැන මදක් සිනා සී නැවත දේවිය දෙස බලා) අපෝ....... දැලිත් ගැවුණා. එහෙම පිටින්ම කළු ගැහිලා (තලියට අත ගසා) අනික, පුපුරලා නේ මැද්දෙන් ම."**

**සේරිවාණිජ :- "කවුරු කැවත් මටනං වැඩක් නෑ සිටු දේවිය. (තලියට ගසා නාද කොට) කවුද මේක රත්තරන් කිව්වේ . මේක මහ බාල ලෝහ වර්ගයක් නෙ."**

**කච්ඡපුට**

**කච්ඡපුට:- "මං කියන්නද ඇත්ත ? මේ තලිය මම ගෙනයන එක යුතු නෑ.මේක සිටු ගෙයටම අයිති පුරාණ බඩුවක්.මෙහේම තියෙන්න අරින එක තමයී හොද."**

**කච්ඡපුට :- මම කියපු එක තේරිලා නෑ මගේ හිතේ. මේක හබෑම වටිනා තලියක්. මේ කළු ගැහිලා තිබුණාට කළවම් නොකරපු හොද ම රත්තරං මේකට ගෙවන්න මා ගාව සල්ලි නැති නිසයි ගෙනියන එක යුතු නෑ කිව්වේ.**

➢ **අවස්ථා සම්බන්ධය.**

ජාතක කතාවෙන් තෝරාගන්නා ලද සිද්ධි සහ අවස්ථා සම්බන්ධය තුල මනා ගැලපීමක් සහිත ව මෙම නාට්‍ය නිර්මාණය කර ඇති අයුරු පහත දැක්වෙන කරුණු මඟින් අනාවරණය කරගත් හැකි වේ.

- අතීත තොරතුරු හෙළිදරව් කිරීම් සඳහා අතීත වක්තෘ කෙනෙක් භාවිතා කිරීම.
- කන්කලු ගීත ගායනය සමග මුලින්ම සේරිවානිජ වෙළෙන්දා වේදිකාවට අවතීර්ණ වීම.
- එම ගීතය ඇසුණු සිටුදුව එතනට පිවිසීම.
- වෙළෙන්දා විසින් වලළලු මිලදී ගැනීමට සිටු දියණිය පෙළඹවීම.
- මිනිබිරිය සෙවීම සඳහා මිත්තණිය ගේ පැමිණීම.
- වළලු මිලදී ගැනීම් සඳහා මිත්තණිය සහ දියණිය විසින් තලිය පෙන්වීම හා එය ප්‍රතික්ෂේප වීම.
- සිටු දියණිය අධික චිත්ත සන්තාපයට පත් වීම.
- කච්ඡපුටගේ පැමිණීම, තලිය හුවමාරුවීම, වළලු සමග කහවණු දහසක් ලැබීම, දැතේ වළලු පැළඳ ගත් සිටු දියණිය ගායනය සමඟ රංගනයේ කිරීම
- සේරිවාණිජ සිටු දිය දියණියගේ එම ගායනයට එක්වෙමින් එතැනට පිවිසීම.
- කච්ඡපුට විසින් තලිය රැගෙන ගිය බව දැනගත් සේරිවාණිජ කච්චපුට හඹායාම.
- නැවතත් අනාගත වක්තෘ විසින් නාට්‍යයේ අවසානය සනිටුහන් කිරීම හා අනාගතය පිළිබඳ තොරතුරු අනාවරණය.

❖ මෙම නාට්‍ය තුළ දැකිය හැකි සුවිශේෂී ලක්ෂණ ලෙස,

- සැබෑ මිනිස් චර්යා ප්‍රකට කිරීම. නිදසුනක් වශයෙන්,
  - සිටු දියණියගේ චරිතය මඟින් ළදැරියක සතු ගති ලක්ෂණ.
  - කූට සහ අවංකව වෙළෙඳුන්ගේ හැසිරීම් රටාවන්.
  - කරුණාවන්ත මිත්තනණියගේ චරිත ස්වභාවය.
- වළලු සහ තලිය ප්‍රබල නාට්‍ය උපකරණයක් බවට පත්ව ඇත. වළලු රුඳවුම් පලම් දණ්ඩ අවසානයේ දී ආයුධයක් ලෙස භාවිතා කර ඇත.
- මුල් නිෂ්පාදනයේ දී ප්‍රධාන වේදිකාවේ සිට ප්‍රේක්ෂකාගාරයට පිවිසෙන දොර දෙසට නෙරා යන සේ අතිරේක වේදිකාවක් භාවිතා කිරීම. (ඉහත සඳහන් කළ පරිදි කබුකි වේදිකාවේ හණාමිටිය නම් කොටස) අවසාන ජවනිකාවේ දී ප්‍රේක්ෂකාගාරය වෙත සේරිවාණිජ ගේ විලාසය ප්‍රබලව නිරූපනය කිරීම සඳහා මෙය භාවිතා කර ඇත.
- සත්පුරුෂ චේතනා තමන්ගේ ජීවිතයට වටිනාකම් එක්කරන අතරම අසත්පුරුෂ චේතනා තමන්ගේ විනාශයට ම හේතු වන ආකාරය නාට්‍යයේ දෘෂ්ටිය මඟින් ප්‍රකට කර තිබීම.

**ඇගයීම:**

1. කදා වළලු නාට්‍යයට දායක වූ චරිත නම් කර එම චරිත තුළ ඔබ දකින චරිත ලක්ෂණ පෙළ ගස්වන්න.
2. ඔබ කැමති පරිදි කදා වළලු නාට්‍යයේ චරිත සඳහා සුදුසු රංග වස්ත්‍රාභරණ නිර්මාණය කරන්න. එය පාට පැන්සල් යොදාගනිමින් වර්ණවත් කරන්න.
3. කදා වළලු නාට්‍යයේ ගැටුම් අවස්ථා නම් කරන්න.
4. කදා වළලු නාට්‍යයේ රංග භූමිය, ආලෝකකරණය, වේශභූෂණය, අංග රචනය, සංගීතය යන අංග පිළිබඳව කෙටි සටහන් ලියන්න.